


CRI
中国国际广播电台
CHINA RADIO INTERNATIONAL


# සූහාසර්

# 蓮花

දෙවන කාණ්ඩය - විශේෂ කලාපය


චීනය සමඟ පෙරට වඩා සහයෝගතා පැවැත්වීමට සූදානම් — පිටුව 02

දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කර ඇති ලිං ගුවං විහාරය — පිටුව 06

2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය බෙයිජිංවලට ලැබෙයි — පිටුව 45

ෆුදැන් විශ්ව විද්‍යාලය — පිටුව 53

අර්තාපල් රූපලාවණ්‍ය ක්‍රම — පිටුව 66


ජාත්‍යන්තර මීටර් 100 පිහිණුම් තරගයේ ආසියානු පළමු රන් පදක්කම හිමි කරගත් නිං සේ හඹ


中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

## චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2330/2374

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka

**අනුශාසකත්වය**
ජගත් අබේසිංහ
සුදත් මධුගල්ල

**සංස්කාරක**
ෂාඕ ජී යං

**කතෘ මඩුල්ල**
ශී යුයෑ, ෂෞ ලී, ලියු හුයි, ෂාඕ ජී යං, චාං යෝ යෝ, හාඕ ලී ෆාං, චං යිං, හැන් ජියැන්, සුන් ජියා ජියා, බූ යුන්, චෙන් ගුවැන් වන්; චන්දන තිලකරත්න, ඩිල්ෂාන් කීර්තිසර, රවිමල් හඳුවල, අනෝජා දිසානායක

**ප්‍රකාශනය**
චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


# පටුන


චීනය සමඟ පෙරට වඩා සහයෝගතා පැවැත්වීමට සූදානම් 02

**චීන සෞන්දර්යය**

දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කර ඇති ලිං ගුවං විහාරය 06

ඉපැරණි ලීච්යං නගරය 09

තේ-අශ්ව පැරණි මාර්ගය 12

**චීන සංස්කෘතිය**

අනුකාරකයාගේ පරාජය 18

කුකුලාගේ හැඬලීමේ සැඟවුණු දියුණුවේ රහස 20

ලඳ බැඳි කවි පද 22

බිම්මල් සේ පිපෙන තේ අවන්හල් 23

සාර්ථක බළලා සහ අසමත් කොටියා 26

මැද සරත් උත්සවය 27

**චීන ආර්ථිකය**

චීන සංචාරකයන් විදේශයන්හි සංචාරය කිරීමේදී ඔවුන්ගේ ප්‍රියතම සංචාරක අංග කවරේද ? 32

පියාගේ සවලෙන් බිහි වූ චීනයේ අංක එකේ ධනවතා 35

පාට පහේ වීවලින් ගොවි ආදායම ඉහළයයි 38

**චීන සමාජ ජීවිතය**

ගයන්න බැරි නම් බඳින්න බැරිවන ෂා ජාතිකයෝ 42

2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය බෙයිජිංවලට ලැබෙයි 45

චාඕ ටියැන් වෙයි ගේ කෝපි අවන්හල 48

ජී පී ආර් එස් සහිත කුණු බාල්දිය 50

ෆුදැන් විශ්ව විද්‍යාලය 53

**චීන භාෂාව**

එදිනෙදා චීන බස 58

2015 අර්ධ වාර්ෂිකය තුළ සී.ආර්.අයි. ශ්‍රී ලංකා කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් 62

**චීන ජීවන රටා**

අර්තාපල් රූපලාවණ්‍ය ක්‍රම 66

පොල් කිරි ගැන ඔබ නොදන්නා දේ 67

වම්බටු ව්‍යංජනය 69

**සී. ආර්. අයි මිතුරන්ගෙන්**

මගේ ප්‍රථම චීන සංචාරය 72

අසන්නන්ගේ බිත්ති පුවරුව 74

**ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන්**

අභයගිරි විහාරය 75

සිව්වන ප්‍රථමාධාර පාඩම - ස්වසනය කරන අසිහි පුද්ගලයෙකුට ප්‍රථමාධාර කරමු 78





# චීනය සමඟ පෙරට වඩා සහයෝගතා පැවැත්වීමට සූදානම්

## ශ්‍රී ලංකා ජනාධිපති

චීන ජනාධිපති ෂී ජින් පිං මහතාගේ ආරාධනාවකට අනුව, ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා 2015 වසරේ මාර්තු මාසයේ 25 වනදා සිට 29 වනදා දක්වා චීනයේ නිල සංචාරයක නිරත විය.

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා මීට පෙර පැවති ආණ්ඩු වලට වඩා වැඩි සහයෝගිතාවක් චීනයෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන බව ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පැවසීය.

ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේ චීනයේ සිව් දින නිල සංචාරය අතර තුර බෙයිජිංහිදී චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල අංශය සමඟ විශේෂ සම්මුඛ සාකච්ඡාවකට එක් වෙමිනි.



පසුගිය ජනවාරි මාසයේ ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයා බවට පත් වීමෙන් පසු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සිදු කළ ප්‍රථම චීන සංචාරය මෙයයි. විශේෂයෙන් ම ජනාධිපතිවරයා චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල අංශයේ විශේෂ සම්මුඛ සාකච්ජාවට එක් වෙමින් වැඩිදුරටත් සඳහන් කළේ වසර දහස් ගණනකට පෙර සිට ම ශ්‍රී ලංකාව සහ චීනය අතර සබඳතා අඛණ්ඩව ශක්තිමත් වෙමින් ඉදිරියට ආ බවයි.

1957 වසරේ දෙරටේ තානාපති සබඳතා ආරම්භ වූයේ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ ආණ්ඩුව පිහිටු වීමෙන් පසුවය. ඊටත් පෙර අත්සන් තැබූ චීන ශ්‍රී ලංකා රබර් සහල් ගිවිසුම විශේෂයෙන් ම මතක් කළ හැකි බව ජනාධිපතිවරයා මෙහිදී පැවසීය. බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ දෙරටේ සබඳතා හොඳින් වැඩි දියුණු වූ බව හෙතෙම එහිදී පෙන්වා දුන්නේ ය.

ඉතිහාසයේ සිට ම ශ්‍රී ලංකාව මුහුදු සේද මාවතේ වැදගත් මධ්‍යස්ථානයක් ලෙසට සැලකේ. චීනය ඉදිරිපත් කළ 21වැනි සියවසේ මුහුදු සේද මාවතේ සහයෝගතා යෝජනාව පිළිබඳව ජනාධිපති සිරිසේන මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුවේ, ඉදිරි සහයෝගතා වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සකස් කළ හැකි බවයි.

චීන ජනාධිපති ෂී ජින් පිං මහතා පසුගිය වසරේ ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරත විය. ඒ අවස්ථාවේදී



දෙරට සහයෝගතා ගිවිසුම් රැසකට අත්සන් තැබීමට සමත් විය. එම ගිවිසුම් නව රජය ක්‍රියත්මක කිරීමට බලාපොරොත්තු වනවා ද යන්න පිළිබඳව චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල අංශය ජනාධිපතිවරයාගෙන් නඟන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා පැවසුවේ එම ගිවිසුම් සහ මෙවර සංචාරයේදී දෙරට අත්සන් තැබූ



වෛද්‍ය හා කෘෂිකාර්මික ඇතුළු ගිවිසුම් කිහිපය තුළින් එළඹුණු එකඟතාවන් පියවරෙන් පියවරට ක්‍රියත්මක කිරීමට ශ්‍රී ලංකාව සූදානම් වන බවයි.



චීන ජනාධිපතිවරයා පසුගිය වසරේ යෙදුණු සංචාරය ශ්‍රී ලංකාවට විශාල ගෞරවයක් බවද එහිදී ජනාධිපතිවරයා සඳහන් කළේ ය. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි විදේශ ප්‍රතිපත්තිය බවත්, ලෝකයේ සෑම රටක් සමඟ ම හිතවත් හා මිත්‍රශීලීභාවයෙන් අපක්ෂපාතීව ශ්‍රී ලංකාව කටයුතු කරන බවත් එම චීන සංචාරයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අවධාරණය කළේ ය.

එම සංචාරයේදී ජනාධිපතිවරයා හා බිරිඳ චීනයේ අධි වේගී දුම්රියේ අත්දැකීම ද ලබා ගත්හ.

ශ්‍රී ලංකාවේ කටයුතු වලට මෙන්ම ජාත්‍යන්තර වශයෙන් තිබෙන කටයුතු වලදීත් චීනය ශ්‍රී ලංකාවට ලබා දෙන සහයෝගය විශේෂයෙන් ම වැදගත් බව, පැවසූ ජනාධිපතිවරයා චීනය අත්කර ගත් පුදුම සහගත සංවර්ධනය තුළින් ශ්‍රී ලංකාව පාඩම් ඉගෙන ගත යුතු බවත්, 1983 වසරේ තමා මුල්වරට චීනයේ සංචාරය කරන විට දුටු චීනයට වඩා මේ වන විට ලබා ඇති සංවර්ධනය ඉතා විශාල බවත් සඳහන් කළේ ය.

ඉදිරිපත් කිරීම : ශී යුයැ





# චීන සෞන්දර්යය



# දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කර ඇති
# ලිං ගුවං විහාරය

බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ නමක් ගාන්ධාර දේශයට ගෙන ගිය බව පැරණි ග්‍රන්ථයෙහි සඳහන් වෙයි. ගාන්ධාරයේ සිට කොටාන් දේශයට රැගෙන ගිය දන්ත ධාතූන් වහන්සේ එහි සිට චීනයේ නැන්පිං නුවරට වැඩම කරන ලද්දේ ෆාහියන් නම් භික්ෂුවක විසිනි. එහෙත් මේ දන්ත ධාතූන් වහන්සේ අද තැන්පත් කර තිබෙන්නේ බෙයිජිං නුවර ලිං ගුවං පරිශ්‍රයේ විහාර මන්දිරයකදීය.

බෙයිජිං නුවරට බටහිරින් ෂි චිං ෂාන් දිස්ත්‍රික්කයේ බා ඩා ජු නමැති උයනක් පිහිටා තිබේ. එය හෙක්ටාර 300ක පමණ භූමි භාගයක් පුරා පැතිර තිබේ. ජුවේ වෙයි,පිං පෝ සහ ලු ෂි කඳු යාය මැදි කර ගත් මේ උයන පුරා අටමස්ථානයට අයත් වෙහෙර විහාර සහ පන්සල්ය. ඒ අතරින් කඳු පාමුල ඇති ලිං ගුවං විහාරය අටමස්ථානයේ වැදගත් ම විහාරය ලෙසට සැලකේ.

බා ඩා ජු උයනේ ප්‍රවේශ දොරටුවෙන් ඇතුළුව විසල් සක්මන් මළුව ඔස්සේ උයන් බිම වෙත ඇවිද යා හැකිය.සක්මන් මළුව කෙළවර මුලින් ම හමුවන්නේ චං අන් විහාරය හෙවත් සදාතනික සාමයේ විහාරයයි. විහාර දොරටුවේ ඇති චීන අක්ෂර සටහනෙහි ඩෙං හුවාන් සි ඩී යනුයෙන් සඳහන් වෙයි. එහි සිංහල අදහස "මිහිබට සුරලොවට පැමිණෝ" යන්නයි.චං අන් විහාරයේ සිට කිලෝමීටර බාගයක පමණ දුරකින් ලිං ගුවං විහාරය පිහිටා තිබේ.

පැරණි ග්‍රන්ථයෙහි සඳහන් වන්නේ 1071 වසරේදී ලිං ගුවං විහාර සංකීර්ණයේ ඉදි



කරන ලද ෂාඕ සියැන් නම් විහාර මන්දිරයේ දන්ත ධාතුන් වහන්සේ තැන්පත් කළ බව ය. මේ දස මහල් මන්දිරයේ සෑම ගඩොලක් ම බුද්ධ රූප සහ ස්තූප රූපයන්ගෙන් සමන්විත වූ නිසා 'දහස් බුදුවර ස්තූපය' යනුයෙන් ද හැඳින්වෙයි. දළදා මන්දිරය නිසා සියවස් ගණනක් තිස්සේ ම ලිං ගුවං පරිශ්‍රය දේශීය හා විදේශීය වන්දනාකරුවන්ගේ පූජනීයත්වයට පාත්‍රව තිබේ.

1900 වසරේදී අධිරාජ්‍ය මිත්‍ර හමුදා බෙයිජිං නුවර ආක්‍රමණය කළේය. යුද්ධයේ ක්රෑරත්වයෙන් මුළු මහත් ප්‍රදේශය ම වැනසිණි. නගරයට ඈතින් පිහිටා තිබු ලිං ගුවං විහාර සංකීර්ණයට ද කාලතුවක්කු වෙඩි වරුසාවලින් ගැලවීමක් නොතිබිණ.දළදා මන්දිරය බිමට ම සමතලා විණි.

යුද්ධය නිම වී විහාර පරිශ්‍රයේ සුන්බුන් ඉවත් කරන භික්ෂුන්වහන්සේට මන්දිරයේ පාදමෙහි තිබූ ගල් මංජුසාවක් හමු විය. මේ මංජුසාව තුළ වූයේ සඳුන් බඳුනකි.එහි මෙසේ සටහන් කර තිබිණි. 'ශාක්‍යමුනි බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ - සටහන් කළේ ෂාන් හුයි, හත්වන තියෙන් හුයි වසරේ 4 වන මාසයේ 23 වන දා' මේ කාල වකවානුව ක්‍රිස්තු වර්ෂ 963 ලෙසට සැලකිය හැකි ය.





දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කරලීම සඳහා නව මන්දිරයක් ගොඩනැංවිය යුතු බව තීරණය කළ චීන බෞද්ධ ජනතාව 1957 වසරේ සැළසුම් සකසා ඉදි කිරීම් ආරම්භ කළහ. 1964 වසරේ ඉදි කිරීම් අවසන් කොට විහාර මන්දිරයේ දළදාව තැන්පත් කෙරිණි.

දළදා විහාර මන්දිරය හෙවත් දළදා ස්තූපය මීටර 51 උසින් යුක්තයි. චීන සාම්ප්‍රදායික ස්තූප රටාවන් පාදක කර ගනිමින් එය නිර්මාණය කර තිබේ. දිව්‍යාලෝක



විහාරය යනුවෙන් ද එය හැඳින්වෙයි.

දළදා ස්තූපයට වම් පසින් ඉහළට නැගෙන පියගැට පෙළ ඔස්සේ මැද මළුවට සහ උඩ මළුවට පිවිසිය හැකි ය. උඩ මළුවේ පූජාසනයේ බුදු පිළිම තුනක් තැන්පත් කර තිබේ.

අතීතයේ සිටි බුදුවරුන් සහ අනාගතයේ පහළවන බුදුවරුන් සංකේතවත් කරමින් කාශ්‍යප බුදු පිළිමය සහ මෛත්‍රී බුදු පිළිමය තැන්පත් කර තිබේ. මැද ඇත්තේ ගෞතම බුදුරජාණන් වහන්සේ සංකේතවත් කරන ශාක්‍යමුනි බුදු පිළිමයයි.

මැද මළුවේ තැන්පත් කර ඇත්තේ සමාධි බුද්ධ ප්‍රතිමාවකි. එය ලිං ගුවං විහාරයට පරිත්‍යාග කළේ ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතායි. පනස් වසරක චීන-ශ්‍රී ලංකා සබඳතා සංකේතවත් කරමින් 2007 වසරේ පෙබරවාරි මාසයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එම සමාධි පිළිමය ලිං ගුවං විහාරයට පරිත්‍යාග කළේය. මෙම ඓතිහාසික වටිනාකමකින් යුතු ඉපාරණි විහාරස්ථානයක ශ්‍රී ලංකාවේ ලකුණ සනිටුහන් වී තිබේ.







ඉදිරිපත් කිරීම : චාං යෝ යෝ



# ඉපැරණි ලීච්යං නගරය

චීන යුවන් නන් පළතේ පිහිටා තිබෙන ලීච්යං නගරය වසර දහදහසක ඉතිහාසයක් සහිත පැරණි නගරයකි. නිරිතදිග චීනයේ ප්‍රසිද්ධ වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස මෙම නරගය හැඳින්විණ. දීර්ඝ කාලයක සිට ම යුන් නන් පළතේ නිෂ්පාදිනය වූ තේ ටිබෙට් කලාපයට ප්‍රවාහනය කිරීමේ තේ-අශ් මාර්ගය නමින් ඉපැරණි මාවත විහිදෙනුයේ ලීච්යං නගරය හරහා ය. වෙළඳ ගනුදෙනු කටයුතු හෙතුවෙන් නාසි, ටිබෙට්, මොන්ගෝලීය, බඅැයි සහා හන් ජාතින්ට අයත් සුළු ජාතික සංස්කෘතිය මිශ්‍ර වී සුවිශේෂ සංස්කෘතියක් ලෙස ලිජිඅන් සංස්කෘතිය නිර්මානය වී තිබේ.

ලීච්යං නගරයේ තැන් තැන්වලදී මෙම සංස්කෘතික ලක්ෂණ දැකිය හැකිය. නාසි ජාතිකයන්ගේ නිවාස මගින් මෙම සුවිශේෂ සංස්කෘතිය පැහැදිලිව පිළිබිඹු කෙරේ. නාසි ජාතිකයන් හන් ජාතික ව්‍යාපරිකයන්ගෙන් ගෘහ නිර්මාණ ශිල්පය ඉගෙන ගත්හ. සම්ප්‍රදායික හන් ජාතික ගෘහ නිර්මාණ ව්‍යුහ අනුව ඉදි කළ පැරණි නිවාස දැනට ලීච්යං නගරයේ නැරඹිය යුතු දර්ශනයකි. විශේෂයෙන්ම ලස්සණ ලී ජාලයකින් බොහෝ නිවාස සරසා තිබේ. එමෙන්ම සම්ප්‍රදායික හන් ජාතික සිතුවම්වල කැපු කපලා ලි ජාල ද ප්‍රසිද්ධ අත්කම් භාණ්ඩ ලෙස සලකන බව වාර්තා වෙයි.

නාසි පැරණි සංගිතය තවත් සුවිශේෂ සංස්කෘතියකි. චීන මින් රජ පෙළපත කාලයේ නාසි ජාතිකයන් ගිනිකොනදිග චීනයේ නන් ජිං නුවරදී සංගිත කලාව ඉගෙන ගෙන තිබේ. ඒ කාලයේ සිට මේවන විටත් එම පැරණි සංගිත සම්ප්‍රදාය පරම්පරිකව සුරක්ෂිත කර ගෙන තිබේ. චීනයේ වෙනත් කලාපවලදී එම සංගිතය වාදනය කිරීමේ හැකියාව හා අදාල සංගිත භාණ්ඩ නොමැති වීම නිසා පැරණි නාසි සංගිතයට චීන ජාතික සංගිත ක්ෂේත්‍රවල ඉතා වාටිනාකමක් හිමි වි තිබේ. නාසි වයස් ගත අය සහභාගි වූ නාසි පැරණි සංගිත කණ්ඩායම විසින් ඉදිරිපත් කළ සංදර්ශන සෑම දිනකම ලීච්යං නගරයේ පැවැත්විණ. එය නැරඹීමට සංචාරකයෝ ඉතාම උනන්දුවක් දක්වති.

පැරණි සංස්කෘතිය පමණක් නොව සියළු පහසුකම් සහිත අමුත්තන්ගේ නිවාස තවත් ලීච්යං නගරික ජීවිතයේ වැදගත් කොටසකි. 5000කට පමණ විවිධ මට්ටමේ අමුත්තන්ගේ නිවාස හා හෝටල ලීච්යං





ඉදිරිපත් කිරීම : සුන් ජියා ජියා

නගරයේ හා ආසන කලාපයේ ඉදි කර ඇත. ලීච්යං නගරයේ හෝටලයක් ඉදි කිරීමට බෝහෝ චීන නාගරික තරුණයන්ගේ බලාපොරොත්තුවකි.

1997 වසරේ ලීච්යං හා එය අයත් ගම් දෙකක් ලීච්යං පැරණි නගරය ලෙස ලෝක සංස්කෘතික උරුම නාමාවලියට ඇතුලත් කරන ලදි. ඉන් පසුව වසර 20ක පමණ කාලයක් ලීච්යං සංචාර්ක කාර්මන්තය වෙගවත්ව සංවර්ධනය කළ තිබේ. පසුගිය වසරේ ලිච්යං නගරයට පැමිණි දෙස් විදෙස් සංචාරකයන්ගේ සංඛ්‍යාව මිලියන 17.32කි. සංචාර්ක කර්මාන්තයේ අදායම් චීන යුඅන් බිලියන 23.8කි. එහි සුන්දර දර්ශනය, බහු ජාතික සංස්කෘතිය හා නිසල ජන ජීවිතය බෝහෝ සංචාරකයෝ ඉහළින් අගය පළ කරති.

එසේ වුවත් සීඝ්‍රයෙන් සංවර්ධනය කළ ලීච්යං සංචාර්ක කාර්මන්තය පැරණි ලිච්යං නගරයට බලපෑම් සිදු කර තිබේ. ඓතිහාසික නටබුන්, කෞතුකාගාරය හෝ ජනතාවට විවෘත නොකළ කොටුව හැර ලීච්යං නගරය ජන ජීවිතය පවතින නගරයක් ලෙස ලෝක සංස්කෘතික උරුම නාමාවලියට ඇතුලත් කරන ලදි. ලීච්යං නගරයේ දැනට ජනග්‍රහණය 25000 දක්වා වැඩි වීම හේතුවෙන් නව සංස්කෘතික හා ජිවිතය මෙන්ම වැඩි වශයෙන් පැමිණි සංචාරකයන් ද මෙම නගරයට බලපෑම් සිදු කර ඇත. එම තත්වය යටතේ පැරණි ලීච්යං නගරයේ සුරක්ෂිත කිරීමේ කටයුතු බෝහෝ අසිරුතාවලට මුහුණ දී තිබේ. යුන් නන් පලාත හා ලීච්යං නාගරික රජය විවිධ විශේෂ සුරක්ෂිත නීති හා රෙගුලාසි පනවමින් නාගරික ඉදි කිරීම, ව්‍යාපරික හා සංස්කෘතිය සංවර්ධන කිරීම යන ක්ෂේත්‍රවල කරුණු සඳහා නීති පත්‍ර ලෙස උපදෙස් ලබා දී තිබේ. එමෙන්ම පැරණි ලීච්යං නගරයේ සුරක්ෂිත කිරීමේ අරමුදලයක් ස්ථාපිත කෙරිණ. සංචාර්ක කර්මාන්තයෙන් ලබා ගත් ලාභයේ කොටසක් හැම වසරකම මෙම අරමුදලයට එක්තු කර ඇත. අදාල සුරක්ෂිත කිරීමේ වැඩසටහන් හා ව්‍යාපෘතිවලට එම අරමුදලයෙන් මුදල් වැය කළ හැකිය.










# තේ-අශ්ව පැරණි මාර්ගය

සේද මාවත ගැන ඔබ අසා ඇත. සේද මාවත යනු පැරණි කාලයේ චීන ජාතිකයන් මධ්‍යම ආසියාවට හා බටහිර ආසියාවට සේද ඇතුළු වෙළෙඳ භාණ්ඩ ප්‍රවාහනය කිරීමට යොදා ගත් වැදගත් වෙළෙඳ මාර්ගයකි.

මෙම ලිපියෙන් දකුණු සේද මාවත වශයෙන් හැඳින්වෙන තවත් පැරණි වෙළෙඳ මාර්ගයක් හඳුන්වා දීම අභිලාෂයයි. මෙම මාර්ගය චීන භාෂාවෙන් 'චා මා ගූ දාඕ' ලෙස උච්චාරණය කෙරේ. සිංහල භාෂාවට පරිවර්තනය කළහොත්, තේ-අශ්ව පැරණි මාර්ගය යන්න ය. මෙම පැරණි වෙළෙඳ මාර්ගය ඔස්සේ ප්‍රධාන වශයෙන් අශ්වයන් හා තේ ඇතුළු වෙළෙඳ කටයුතු සිදු කෙරුණු බව එම නාමයෙන් පැහැදිලි වෙයි.

මෙම මාර්ගයට මාර්ග ජාලයක් හිමි ය. නිරිතදිග චීනයේ ස්චුවාන් පළාත, යුන්නාන් පළාත, ටිබෙට් ස්වායත්තය සහ දකුණු ආසියාව ඊට සම්බන්ධ ය. මෙම මාර්ග ජාලය පිහිටි ස්ථානවල භූගෝලීය තත්වය සුවිශේෂී බැවින් එය ලොව අලංකාරම සංචාරක මාර්ගය හැටියට සැළකේ.

මෙම මාර්ගයේ දිග ප්‍රමාණය කිලෝමීටර් 4000කි. උප නිවර්තන වනාන්තර, විචිත්‍රවත් වැව් හා ගංගා, හිමෙන් වැසුණු උස් කඳු, මෙම මාවත දෙපැත්තේම පිහිටා තිබේ.

ඒ පමණක් නොව, ටිබෙට් ස්වායත්තය, යුන්නන් පළාත සහ ස්චුවාන් පළාත යන ප්‍රදේශවල සුවිශේෂී චීන සුළු




ජාතිකයෝ සාමූහිකව වාසය කරති.

පැරණි කාලයේ සිට, ටිබෙට් ජාතිකයන්ට තේ පානය කිරීමේ පුරුද්දක් හිමිව තිබේ. ඔවුන්ගේ කැමතිම තේ වර්ගය වනුයේ බටර් තේ. එහෙත්, ටිබෙට් ප්‍රදේශයේ තේ වර්ග වැවෙන්නේ නැත. එහි මිනිසුන්ට චීනයේ සෙසු ප්‍රදේශවලින් තේ රැගෙන යාමේ ඉල්ලුමක් තිබේ.

මේ අතර, ටිබෙටයට නුදුරින් පිහිටි යුන්නන් පළාත සහ ස්චුවාං පළාත යන ප්‍රදේශවල තේ කොළ ඉතා ප්‍රකට ය. එහෙත්, එම පළාත් දෙකේ මිනිසුන්ට හොඳ අශ්වයන් පිළිබඳ ඉල්ලුමක් තිබේ. හොඳ අශ්වයන් සොයා ගත හැක්කේ උස් බිමේ පිහිටි ටිබෙටයේ ය. එබැවින් හුවමාරු ඉල්ලුම් ඇති විය. එක් පැත්තට තේ අවශ්‍යයි. අනිත් පැත්තට හොඳ අශ්වයන් අවශ්‍යයි.





මෙම අනුපූරක ඉල්ලුම් නිසා තේ-අශ්ව පැරණි මාර්ගය බිහි විය.

වෙළෙඳ භාණ්ඩ අතරින්, තේ පිළිබඳව කතා නොකළ නොහැක. යුන්නන් පළාතෙන් හා ස්චුවාන් පළාතෙන් බාහිර ප්‍රදේශවලට ප්‍රවාහනය කළ හැකි තේ කොළ රවුම් හැඩයට පදම් කළ යුතු ය. එහෙත් මාර්ගය ඉතා දුර නිසා ප්‍රවාහනය කරන විට තේ කොළ යම් ප්‍රමාණයකට පැහීමේ අවස්ථා තිබේ. එහි රසය වෙනස් වුවද සුවඳයි. ටිබෙට් ජාතිකයන්ගේ බටර් තේවල අමුද්‍රව්‍ය මෙය.

තේ සහ අශ්වයන් හැර, ටිබෙට් ජාතිකයන්ට අවශ්‍ය රෙදි, ලුණු, එදිනෙදා අවශ්‍ය භාණ්ඩ සහ චීනයේ සෙසු ප්‍රදේශවලට අවශ්‍ය ලොම් නිෂ්පාදිතයන් සහ ටිබෙට් ඖෂධ ඇතුළු බොහෝ භාණ්ඩ මෙම පැරණි වෙළෙඳ මාර්ගය මගින් ප්‍රවාහනය කර තිබුණි.

තේ-අශ්ව පැරණි මාවත ඔස්සේ වෙළෙඳ භාණ්ඩ හුවමාරු සිදු කෙරුණු මෙන්ම බුද්ධාගම ව්‍යාප්ත වීමට මෙම මාවතෙන් ඉමහත් කාර්යභාරයක් ඉටු කෙරිණ.

මෙම මාර්ගයේ ප්‍රධාන ශාඛා දෙකක් තිබේ. යුන්නන් පළාතේ සිට නැගෙනහිර හා මධ්‍යම ටිබෙටය හරහා නේපාලය සහ ඉන්දියාව දක්වා දිවෙන මාවත එම ශාඛා දෙකෙන් එකකි. අනිත් එක, ස්චුවාන් පළාතේ සිට ටිබෙටයේ ලාසා නගරය හරහා නේපාලය හා ඉන්දියාව දක්වා දිවෙයි.

පසුගිය සියවසේ 60 දශකය වන විටත්, එම මාර්ග යෙන් සිදු වූ වෙළෙඳ කටයුතු බහුලව තිබුණි. එහෙත්, සමස්ත චීනයේ ගමනාගමන පහසුකම් යහපත් වීමත් සමඟම, එම මාර්ගයේ වෙළෙඳ කාර්යභාරය අඛණ්ඩව අඩු විය. එහි තිබෙන සරුසාර සංස්කෘතික උරුමයන් හා ඉහළ සංචාරක වටිනාකම හේතුවෙන් දැන් එම මාර්ගය සංස්කෘතික ශාස්ත්‍රඥයන් සහ සංචාරකයන්ගේ දැඩි ඇල්මට ලක් වී තිබේ.

බෞද්ධාගමික සංස්කෘතිය ඉන් විශේෂත්වයකි. යුන්නන් පළාත, සුළු ජාතිකයන් බොහෝ පිරිසක් වාසය කරන පළාතකි. චීනයේ සුළු ජාතීන් වර්ග 55න් 25ක් යුන්නන් පළාතේ වාසය කරයි. එහි වෙසෙන නාෂි





ජාතිය සහ බයි ජාතිය ටිබෙට් බුද්ධාගමේ බලපෑමට ලක් වී තිබේ. යුන්නන් පළාතේ නාෂි ජාතික ප්‍රදේශවල ටිබෙට් බෞද්ධාගමික ආරාම 20කට වැඩි ප්‍රමාණයක් තවමත් දැකිය හැකි ය.

බුදු දහමේ බලපෑම නිසා සම්බන්ධ වූ නාෂි, බයි සහ ටිබෙට් යන ජාතීන් තුන අතර ආර්ථික හා සංස්කෘතික හුවමාරු බහුල වී තිබුණි. තේ-අශ්ව පැරණි මාවතේදී, බෞද්ධ සැදැහැවතුන් භාෂාණවල කැටයම් කළ බුදු පිළිම බොහොමයක් දක්නට ලැබේ. බුදු රජාණන් වහන්සේ, බෝධිසත්වයන් සහ රහතන් වහන්සේලාගේ රූප සහිත බෞද්ධ ප්‍රතිමා විශාල ප්‍රමාණයක් මෙම මාවත ඔස්සේ සොයා ගත හැක.





බුදු දහම හැර, චීනයේ සාම්ප්‍රදායික ආගම වන තාඕ ආගම, ඉස්ලාම් ආගම ද එහිදී තිබේ. ඒ වගේම, ටිබෙට් ජාතිකයන්ගේ ජනප්‍රිය බටර් තේ, යුන්නන් පළාතේ සහ ස්චුවාන් පළාතේ රස විඳීමේ අවස්ථා තිබේ.

මෙම වෙළෙඳ හුවමාරු මගින්, චීනයේ හන් ජාතිය සහ ටිබෙට් ජාතිය අතර අනුපූරක ආර්ථික සබඳතාවක් ඇති වී තිබේ. ජාතීන් දෙකේ අතර මිත්‍රත්වය ඉන් තහවුරු වී ඇත.

වසර දහසකට කලින් පැවතුණු චීනයේ සොන් රාජධානිය ටිබෙට් ප්‍රදේශයේ කිසිදු හමුදා භටයෙක් ස්ථානගත කළේ නැති නමුත්, මෙම සමීප සබඳතාව දුර්වල වූයේ නැත.

වසර 1840 දියත් වූ අබිං යුද්ධයෙන් පසු, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදියෝ ටිබෙටය ආක්‍රමණය කිරීමට සැළසුම් කළහ. චීන තේ වෙනුවට ඉන්දීය තේ ටිබෙටයට අව මිලට ප්‍රවාහනය කිරීම මගින් බ්‍රිතාන්‍යය ටිබෙටය චීනයෙන් වෙන් කිරීමට උත්සාහ දැරීය. ජාතික ස්වෛරීභාවය ආරක්ෂා කිරීමට එවක ටිබෙට් ජාතිකයන්, දාලයි ලාමාවරයා සහ එවක ස්චුවාන් පළාත් රජය ඉන්දීය තේ ටිබෙටයේ අලෙවිය වැළැක්වීමට වෙහෙස දැරූහ.

තේ වර්ග යහපත් කිරීම, තේ සමාගම් පිහිටුවීම, තේ ප්‍රවාහන වැඩපිළිවෙළ සරළ කිරීම ඇතුළු කටයුතු මගින් ස්චුවාන් පළාතෙන් ඉක්මනින්ම ටිබෙටයට ප්‍රවාහනය කිරීමට හැකි විය. ස්චුවාන් තේ, හන් සහ ටිබෙට් ජාතීන් දෙක ඒකාබද්ධව බ්‍රිතාන්‍යයේ ආක්‍රමණයට විරුද්ධ වීමේ ප්‍රබල ආයුධයක් බවට පත් විය.

ඉදිරිපත් කිරීම : ෂාඕ ජී යං



# චීන සංස්කෘතිය

# අනුකාරකයාගේ පරාජය

මේ චීනයේ ආප්තෝපදේශ කතාවක්. පැරණි කාලයේ, චී නමැති කුඩා රාජ්‍යයක් පැවතුණා. එහි අධිරජයා ශුවාන් වාං. ඔහු සංගීත ලැදියෙක්. විශේෂයෙන්ම 'යූ' නමින් හැඳින් වන හොරනෑ බටනලාව වාදනයට ඔහු ඉතා කැමැත්තෙන් සිටියා. මේ වාද්‍ය භාණ්ඩයේ මුල් කොටස හොරනෑවක් වාගේ. අග කොටසට බටනලා කීපයක් සවි කර තියෙනවා. ශුවාන් වාං අධිරජයා හොරනෑ බටනලාවේ සාමූහික වාදනයට විශේෂයෙන් ප්‍රිය කළා. හොරනෑ බටනලා වාදකයන් 300 දෙනෙකුගෙන් සමන්විත වාදක කණ්ඩායමක් ඕනෑම වේලාවක අධිරජයා වෙනුවෙන් වාදනය කරන්නට සූදානමින් සිටිනවා.

නන් ගෝ නමැති පුද්ගලයෙක්, අධිරජයාගේ මේ ආශාව ගැන දැන ගත්තා. මුදල් උපයා ගැනීමේ හොඳ අවස්ථාවක් උදා වෙලා කියලා ඔහුට තේරුණා. ඔහුට උපක්‍රමීය ව ඒ වාදක කණ්ඩායමට එක් වුණා.

එතැන් සිට නන් ගෝ ඒ වාදක කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන් මාසිකව හොඳ ආදායමක් ලබන්න පටන් ගත්තා. ඇත්තටම නන් ගෝ හොරනෑ බටනලා වාදනය ගැන මොකුත්ම දන්නේ නැති කෙනෙක්. හැම වරක්ම වාදනය කරන කොට ඔහු වෙන වාදකයන්ගේ හැසිරීම් අනුකරණය කරමින් වාදනය කරන බවට රඟපෑවා. මුහුණෙනුත් සැලකිලිමත් බවක් පෙන්නුවා. වාදනයට කිසිදු දායකත්වයක් ලබා දුන්නේ නැතුව නන් ගෝට වෙනත් ශිල්පින් වගේම හොඳ සැලකිල්ලකුත් ලැබුණා.

හැබැයි ඕනෑ කෙනෙකුට අසීමිත වාසනාවක් හැම විටම හිමි වෙන්නේ නෑ. අවුරුදු කිහිපයකට පස්සේ චී රාජ්‍යයේ ශුවාන් වාං අධිරජයා මැරුණා. ඔහුගේ පුතා, මින් වාං අධිරජ ධුරයට පත් වුණා. මින් වාං අධිරජයාත් ඔහුගේ පියා වාගේ හොරනෑ බටනලා වාදනය අහන්න කැමතියි. ඒ වුණාට ඔහු කැමති ඒකල වාදනයට මිස, සාමූහික වාදනයට නෙවෙයි. හොරනෑ බටනලා වාදන
























කණ්ඩායමේ සියළු සාමාජිකයන් හොඳට පුහුණු වී එක්කෙනෙකුගෙන් එක්කෙනෙකුට මාරුවෙන් මාරුවට තමා වෙනුවෙන් හොරනෑ බටනලාව වාදනය කරන්න නව අධිරජයා නියෝග කළා. සියළුම ශිල්පින් ඒකට බොහෝ උනන්දුවෙන් පුහුණු වීම් කරන්න පටන් ගත්තා. නන් ගෝ නම් එහෙම කළේ නැහැ. මේ අවස්ථාවේදී ඔහු හරියට රත් වූ බඳුනක ඉන්න කුහුඹුවකු වාගේ ඉතාමත් නොසන්සුන්ව සිටියා. අවසානයේ ඔහු පලා යන්න තීරණය කළා.

නන් ගෝ වගේ පුද්ගලයන්ට නියම ශිල්පය, කුසලතා සහ දක්ෂකම නැත්තත් එක්තරා අවස්තාවක වාසනාවක් ලැබෙන්න ඉඩකඩක් තියෙනවා. ඒ වුණාට බොරුව ඇත්තක් වෙන්න බැහැ. සාර්ථකත්වය ළඟා කර ගැනීමට උද්‍යෝගිවත්ව ඉගෙන ගැනීම මිස, වෙන අව්‍යාජ මාර්ගයක් පවතින්නේ නෑ. අද මේ කතාව උපමා කතාවක් සේ චීනයේ ප්‍රචලිත වී තියෙනවා. 'ලාං යූ චොං ශූ' ලෙස එය චීන බසින් කියනවා. වාදකයෙකු නොවී කණ්ඩායමේ වාදකයකු ලෙස රඟපෑම යන්න එහි අරුතයි.

ඉදිරිපත් කිරීම : ලියු හුයි



# කුකුලාගේ හැඬලීමේ සැඟවුණු දියුණුවේ රහස

මේ මීට වසර 1500කට කලින් සිදු වුණු කතාවක්. ඒ කතාව චීන පිරුළක් ලෙස සටහන් වී තියෙනවා. චීන බසින් කිව්වොත් 'වෙන් ජී චී වූ'. එය සිංහලට පෙරලූවොත්, කුකුලාගේ හැඬලීම ඇසුණු වහාම කඩු සරඹ පුහුණු වීම යන අර්ථය එයින් කියැවෙනවා.

මේ කතාවේ ප්‍රධාන චරිතය සූ ටී නමැති දොං චින් යුගයේ ජනරාල්වරයෙක්. කුඩා කාලයේ සූ ටී ඉතාම දඟ ළමයෙක්. තරුණ වයසට පිවිසුණාට පස්සේ තමාගේ නූගත්බව ගැනත් දුර්වලබව ගැනත් ඔහුට තේරුණා. ඔහු උද්‍යෝගිවත්ව පොත් කියවන්න පටන් ගත්තා. ඉතිහාසය ගැන විශේෂයෙන් ඉගෙන ගත් ඔහුට පොහොසත් දැනුම් කෝෂයක් තිබුණා. සූ ටී සහ ඔහුගේ මිතුරෙක් වන ලියු කුන් යන දෙදෙනාම ප්‍රාදේශීය රාජ්‍ය ලේකම්වරු වශයෙන් කටයුතු කළා. ඒ දෙන්නා හොඳම මිතුරන් වුණා. බොහෝ දේවල් කළේ එකට. ඒ වාගේම දෙන්නාටම සමාන ජීවන අභිලාෂ තිබුණා. මව්රට වෙනුවෙන් බුද්ධියෙන් සහ ශක්තියෙන් පමණක් නෙවෙයි, ජීවිතය වුණත් පුදන්න තරම් අධිෂ්ඨානයක් ඔවුන්ට තිබුණා.

දවසක් අලූයම වේලාවේ නිදා සිටි සූ ටීට කුකුලන්ගේ හැඬලීම ඇසී ඇහැරුනා. ඔහු ලියු කුන් අවදි කරවා මෙහෙම කීවා:

'ඔයාට කුකුලා හඬලනවා ඇහුණා ද?'

'ඔව්. මේ වේලාවේ නම් ඒ හඬින් අවාසනාවන්තභාවය කියැවෙනවා කියලා මිනිසුන් විශ්වාස කරනවා නේ ද?'

'සාමාන්‍යයෙන් මිනිසුන්ට එහෙම හිතෙයි. හැබැයි මම එහෙම හිතන්නේ නෑ. අපි ඉදිරියේදී මෙහෙම කරමු ද? අපි කුකුලා හැඬලීම ඇසුණු වහාම නැගිටලා කඩු ශිල්පය පුහුණු වෙමු ද?'

ලියු කුන් ඒ අදහසට එකඟ වුණා. එදා ඉඳලා ඒ මිතුරන් දෙන්නා ඇත්තටම සැම දාම අලූයම කුකුල් හැඬලීම ඇසුණාම නැගිටලා කඩු සරඹ පුහුණු වෙන්න පටන් ගත්තා. ඔවුන් එසේ කළේ මහ සුළං හෝ අධික වර්ෂා පතනය වැනි නරක දේශගුණයත් නොතකා. අන්තිමේදී දැනුමෙන් මෙන්ම ශක්තියෙන් යුත් ඒ දෙන්නාම ජනරාල් ධුරයට පත් වුණා. තම නිපුණතාවෙන් මව්රටට දායක වීමේ අධිෂ්ඨානය ඉටු කිරීමටත් ඔවුන්ට හැකි වුණා.

'වෙන් ජී චී වූ' එහෙමත් නැත්තම් කුකුල් හැඬලීම ඇසූ වහාම නැගිටලා කඩු සරඹ පුහුණු වීම යන පිරුළ උද්‍යෝගිමත්බව ගැන කතාවක්. එහෙත් හොඳ මිතුරන් එක්ක යහපත් අභිලාෂයක් වෙනුවෙන් එකිනෙකා දිරි ගන්වමින් උත්සාහ කිරීමේ වැදගත්කමත් මෙයින් පිළිබිඹු වෙනවා.









ඉදිරිපත් කිරීම : ලියු හුයි



# ලඳ බැඳි කවි පද

ඉදිරිපත් කිරීම : ලියු හුයි



හන් රජපෙළපතේ ස් මා සයාං රූ නමැති ප්‍රසිද්ධ කවියෙක් සිටියා. ඔහු පෙම් ගීතයක් නිර්මාණය කොට එමගින් ලස්සණ තරුණියක් සමග විවාහ වෙන්න පුළුවන් වුණු බව ඉතිහාසයේ සඳහන් වෙනවා. 'වීණාවේ ගීතය' එම කවියේ තේමාව. ස් මා සයාං රූ වීණාවක් වාදනය කරමින් මේ කවිය ගායනා කරමින් ඔහු ආදරය කළ තරුණියට ආදර හැඟීම් ප්‍රකාශ කළ බවත් සඳහන් වෙනවා. ඒ උණුසුම් පෙම් හැඟීම්වලින් යුතු ගීතය අහලා ස් මා සයාං රූ හා විවාහ ජීවිතයට එළඹීමට ඒ තරුණිය ඒ මොහොතේම තීරණය කළා.

琴　　　歌

--司马相如

凤兮凤兮归故乡，遨游四海求其皇。

时未遇兮无所将，何悟今兮升斯堂！

有艳淑女在闺房，室迩人遐毒我肠。

何缘交颈为鸳鸯，胡颉颃兮共翱翔！

## වීණාවේ ගීතය

විහඟ රජු. මා ෆිනික්ස්.
මම මගේ මව් බිමට ආයෙමි.
සතර මහ සාගර සරා
සහකාරියක සොයා
ඒත් එයට පිළිසරණක් නැත.
අත පාන මායිමේ කිසිවෙකුත් නැති කළ
දැන් මම මේ ශාලාවේය
හැකි වේ ද මට අපේක්ෂා දල්වන්නට?
ළඳුන්ගේ කුටියේ සොඳුරු කන්‍යාවියක වෙයි.
ළඟින් සිටියත් ඈ දුරස්තය මා වෙතින් .
අහෝ මා හද සැළෙයි.
කෙසේ නම් අපි වැතිර ගමු ද
ආදර විහඟ යුවලක් සේ
හැකි වේ ද එක්ව පියා සලන්නට
නුඹ ගැබ
කිසිදා වෙන් නොවී.







ෆිනික්ස් කුරුල්ලා සහ ෆිනික්ස් කිරිල්ලිය අතර උණුසුම් ප්‍රේමය ඇසුරු කොට මානව ප්‍රේමය වර්ණනා කිරීම චීන සාහිත්‍යයේ නිරන්තරයෙන් දැකිය හැකියි. ස් මා සයාං රූගේ ඒ කවියේදී ෆිනික්ස් කුරුල්ලෙක් තමා ආදරය කරන ෆිනික්ස් කිරිල්ලිය සොයා ගැනීමට දරන උත්සාහය පෙන්නුම් කෙරෙනවා.

ඓතිහාසික ග්‍රන්ථ සටහන්වලට අනුව, ස් මා සයාං රූ, කවි නිර්මාණය කරන්න දක්ෂ වූ නිසා ඉතා ප්‍රසිද්ධ වුණා. වරක් ආරාධනාවකට අනුව ඔහු අමුත්තෙක් වශයෙන් කළින් නොගිය නිළධාරියෙකුගේ නිවසකට පැමිණියා. මේ නිළධාරියාගේ දියණිය ලස්සණ සහ බුද්ධිමත් තරුණියක් බව මීට පෙර ඔහු අහලා තිබුණා. ඒත් පැරණි චීන රෙගුලාසියට අනුව අවිවාහක තරුණියන් සාමාන්‍යයෙන් අමුත්තන් හමු වෙන්නේ නැහැ. ඒ තරුණියගේ අවධානය ලබා ගැනීමට ස් මා සයාං රූ මේ පෙම් කවිය ගීතයක් ලෙස ගායනා කළා. ඉතා උණුසුම් සහ සුන්දර වූ මෙම පෙම් කවිය අහලා ඒ තරුණිය ස් මා සයාං රූ හා ආදරයෙන් බැඳීමට තීරණය කළා. අන්තිමේදී ඔවුන්ට සිය අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීමට හැකි වුණා. හොඳ කවියකින් කෙතරම් අපූරු ප්‍රතිඵලයක් බිහි වනු ඇත්දැයි ඉන් අපට අවබෝධ වෙනවා.





# බිම්මල් සේ පිපෙන තේ අවන්හල්

ඉදිරිපත් කිරීම : ලියු හුයි

තේ පානය කිරීම ශ්‍රී ලාංකිකයන්ට වගේම චීන ජනතාවගේත් ජීවන පුරුද්දක්. චීනයේ සංචාරය කරනවා නම් ඔබට තැන්තැන්වල තියෙන තේ අවන්හල් දකින්න පුළුවන්.

චීනයේ තේ අවන්හල් වර්ග කීපයක්ම තියෙනවා. තේ පමණක් සැපයෙන අවන්හල්, පොත් කියැවීමේ පහසුකම් සැපයෙන තේ අවන්හල්, චෙස් ක්‍රීඩා තේ අවන්හල් මේ අතරින් කීපයක්. ඍතුවට අනුව විවෘත කෙරෙන තේ අවන්හලුත් තියෙනවා. මිනිසුන් තමන් කැමති විධියට විවිධ තේ අවන්හල්වලට ගිහිල්ලා එම ආශ්වාදය විඳිනවා.

පැරණි චීනයේ චිං රාජ වංශය, එනම් ක්‍රිස්තු වර්ෂ 1636 සිට 1911 දක්වා කාලය තුළ බෙයිජිං නගරය අද වගේම චීනයේ දේශපාලන කේන්ද්‍රස්ථානය වුණා. එකල තේ අවන්හල් රාජකීය ඥාතින් සහ නිලධාරීන්ට පමණක් නිරන්තරව යා හැකි විනෝදාත්මක ස්ථාන ලෙස සැලකුණා. එම තේ අවන්හල්වල සාමාන්‍යයෙන් නාට්‍ය වේදිකාත් තිබුණා. සවස හා රාත්‍රී කාලයේදී බෙයිජිං ඔපෙරා සහ යුගල විහිළු කතා වැනි සංදර්ශන පැවැත්වුණා. ඒ කාලයේ බොහෝ කලා ශිල්පීන් ප්‍රසිද්ධ වෙන්න පටන් ගත්තේ තේ අවන්හල්වල රඟ පෑම නිසා.

නව චීනය පිහිටුවීමට පෙර හා පසු කාලය තුළ, රටේ යුදකාමී තත්වය හා දිළිඳුකම නිසා තේ අවන්හල් පිරිහීමකට පත් වුණා. 70, 80 දශකයේ සිට චීනයේ ප්‍රතිසංස්කරණය හා විවෘතභාවය සමගම තේ සංස්කෘතියට පුනර්ජීවනයක් ලැබුණා. මහ ජනතාවගේ ජීවිතය පොහොසත් හා සරුසාර වුණා. මේ සමගම තේ අවන්හල් වැඩිම තේ බොන ජනගහණයක් සිටින චීන භූමිය මත බිම්මල් වගේ මතු වෙන්න පටන් ගත්තා.

චීනයේ අගනගරය වන බෙයිජිංවල සංචාරය කරනවා නම්, ලාඕ ශේ තේ අවන්හලට අනිවාර්යෙන්ම යන්න ඕන. එතනදී ඔබට නියම චීන තේ රස බලන්න පුළුවන්. ඒ පමණක් නොව, බොහෝ බෙයිජිං ආවේණික කලා භාණ්ඩ සහ සංදර්ශන බලන්නත් පුළුවන්.

බෙයිජිංවල පමණක් නොවෙයි, දැන් චීනය පුරාම තේ අවන්හල් ජනප්‍රිය බව කිව්වොත් වඩාත් නිවැරදියි. බෙයිජිං පිහිටා ඇත්තේ උතුරු චීනයේ. මෙහි තේ අවන්හල්වල රාත්‍රී කාලයේ කාර්ය බහුල තත්වයක් පෙන්නුම් කරනවා. ඒ බොහෝ සංදර්ශන සංවිධාන කර ඇත්තේ රාත්‍රී කාලයේ පමණක් නිසා. ඒත් දකුණු



චීනයේ ඒ තත්වය වෙනස්. එහි තේ අවන්හල්වල දවසේ උණුසුම්ම කාලය උදේ කාලයයි. උදේවරුවේ තේ අවන්හලකට ගිහිල්ලා උදේ කෑම අනුභව කොට තේ පානය කිරීම බොහෝ දකුණු චීන මිනිසුන්ගේ පුරුද්දක්. තේ බොන කොට නිකම් සිටින්නේ නෑ. ඔවුන් යාළුවන් එක්ක කතා බහ කරනවා. එහෙමත් නැත්තම්, හතර දෙනෙකු එකතු වෙලා මා ච්‍යාං නමැති ක්‍රීඩාවේ යෙදෙනවා. බොහෝ අයට, විශේෂයෙන් වැඩිහිටියන්ට නම් මුළු උදේ කාලයේම තේ අවන්හල්වල ගත කිරීම අමුතු දෙයක් නෙවෙයි.

අවුරුදු කීපයකට පෙර තේ අවන්හල්වලට යන්න පුරුදු වුණු වැඩි පිරිස වැඩිහිටියන් වුණා. දැනට නම් තේ අවන්හල්වලට යෑම තරුණයන්ගේත් පුරුද්දක් බවට පත් වී තියෙනවා. ව්‍යාපාරිකයන් නම්‍යශීලිව හා ආකර්ශනීයව තේ අවන්හල් කළමනාකරණය කිරීම නිසා ඒවාට යන පිරිස් ක්‍රමයෙන් වැඩි වුණා. චීන තරුණ පරපුර විලාසිතා ජීවිතය අතහැර සම්ප්‍රදායික ජීවිතයට වැඩි ලැදියාවක් දැක්වීම ඊට වඩා වැදගත් සාධකයක් ලෙස සැලකිය යුතුයි.

තේ අවන්හල් පෙම්වතුන් පෙම්වතියන්ගේ පෙම්උයන බවට පත් වී තියෙනවා. ව්‍යාපාර කටයුතු ගැන සාකච්ඡා කිරීමේ මනා පරිශ්‍රයක් ලෙස සලකා ව්‍යාපාරිකයන් තේ අවන්හල් පාවිච්චි කරනවා. කෙසේ වුවත් තේ අවන්හල්වල කැපී පෙනෙන ජනප්‍රියත්වය චීන ලක්ෂණයක් ලෙස හැඳින් විය හැකියි.











# සාර්ථක බළලා සහ අසමත් කොටියා

ඉදිරිපත් කිරීම : ෂෙං ලී





ආත්ම විශ්වාසය අඩු පිරිමි ළමයෙක් හිටියා. ඊට හේතුව ඔහු පාසලේ දුර්වල ශිෂ්‍යයෙක් වීමයි. ගුරුවරු උගන්වන දේ හොඳට ඉගෙන ගෙන විභාගවලින් හොඳ ලකුණු ලබා ගන්නට ඔහු බොහෝ වර වෑයම් කළත් ඔහුගේ උත්සාහය කොහොමවත් ම හරි ගියේ නෑ. ඉගෙනුම පිළිබඳ මේ පිරිමි ළමයාට තිබූ දුර්වලතා නිසා පාසල් කීපයකට මාරු වීමට පවා සිදු වුනා. මෙයින් ඔහුගේ ආත්ම විශ්වාසයට තවත් විශාල පහරක් වැදුණා.

දැඩි සිත් තැවුලකට පත් ව සිටි මේ පිරිමි ළමයා දවසක් එයාගේ පියාගෙන් ඇසුවා:

'තාත්තේ, තාත්තේ, මම මෝඩ ළමයෙක් ද?'

'නෑ. එහෙම එකක් නෑ පුතේ.'

'එහෙම නම් ඇයි කොච්චර උත්සාහ කළත් මට වෙන ළමයින් වගේ හොඳට ඉගෙන ගන්න බැරි?'

පියා නිහඬ වුනා. තම පුත්‍රයා මෝඩ ළමයෙක් නොවන නමුත් උපතින් ම අකුරු ලිවීම වැනි දේවලට සංවේදී නැති නිසා පාසලේ ඉගෙනුම ලබද්දී යම් යම් ගැටළු සහගත තත්වයන් ඇති වුන බව පියා දැන ගෙන හිටියා. එහෙත් මෙය කුඩා ළමයෙකුට පහදා දීමට සුදුසු ක්‍රමයක් පියාට සොයා ගත නොහැකි වූ නිසා තම පුත්‍රයා නැගූ ප්‍රශ්නයට නිරුත්තර වුනා.

පිරිමි ළමයා පෙරටත් වඩා බාහිර ලෝකයෙන් වෙන් වෙන්නට පටන් ගත්තා. ඔහු බොහෝ විට සිටියේ තමාගේ කාමරයේ විතරයි.

තම පුත්‍රයාගේ ඇඳේ එක් එක් චිත්‍ර විසිරී තිබෙනවා වරෙක පියා දුටුවා. පියාට විශාල කුතුහලයක් ඇති වුනා. පුත්‍රයා ඇඳි එම චිත්‍ර අතට ගෙන හොඳින් බැලුවා. ගුරුවරුන් හා සෙසු පාසල් දරුවන් එම චිත්‍රවල හාස්‍යජනක විදියට සිත්තම් කිරීම තුළින් තම පුත්‍රයා පාසලේදී විඳි දුක හා අසහනය පිට කළ බව පියාට වැටහුණා.

පිරිමි ළමයාගේ ඉගෙනුම් කටයුතුවල කිසිදු දියුණුවක් ලැබුවේ නෑ. එබැවින් ඔහුගේ පියාට නිතර ම ගුරුවරුන් හමු වෙන්නට සිදු වුනා. එහෙත් පිරිමි ළමයා කවර දිනෙක වත් පියාගෙන් බැනුම් ඇහුවේ නෑ. තම කාමරයට වී නිදහසේ සිත්තම් කරන්නට පියා පුත්‍රයාට අවකාශ සලසා දුන්නා. එපමණක් නොව පුත්‍රයාගේ පාළුව තුනී කරන්නට පියා පුත්‍රයාට සුරතල් බළලෙකුත් ගෙනවිත් දුන්නා.

පියා තමාට සලකන හැටි දුටු පිරිමි ළමයාට ටිකක් පුදුම හිතුනා.

'තාත්තේ, මං ගැන ඔයා සම්පූර්ණයෙන් ම බලාපොරොත්තු අත් හැරිය නිසා ද මං ගැන වැඩියෙන් හොයලා බලන්නේ නැත්තේ?'

පිරිමි ළමයා පියාගෙන් ඇසුවා.

පියා පොඩ්ඩක් නිහඬ වී කීවා:

'පුතේ, සති අන්තයේ මම ඔයා ව සත්වෝද්‍යානයට එක්කං යන්නම්.'

එම සති අන්තයේ සත්වෝද්‍යානයේ සෙනඟ පිරුණා. බොහෝ අය එහි කොටියෙක් ඉදිරිපිට ගැවසී දැඩි උනන්දුවෙන් කොටියා නැරඹුවා. සෙසු අය වගේ පිරිමි ළමයා පියාත් එක්ක එම කොටියා ළඟට ගියා. එතනදී කොටියා නරඹමින් පියා කලින් පුත්‍රයා නැගූ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා.

සත්වෝද්‍යානයෙන් ආපසු ආවාට පස්සේ පිරිමි ළමයාගේ ආත්ම විශ්වාසය පුදුම විදියට වර්ධනය වී තිබුනා. නව බලාපොරොත්තුවක් සිතේ දළු ලා ගෙන ඔහු ප්‍රබෝධවත් වුනා. කාටුන් චිත්‍ර ශිල්පය තම ජීවිතයේ වැදගත් ම දේ ලෙස සලකා ඔහු ඒ වෙනුවෙන් ප්‍රයත්න දැරුවා.

පිරිමි ළමයා අවුරුදු විසි පහේදී චීනයේ කාටුන් චිත්‍ර කරලියේ ඉතා දීප්තිමත් චරිතයක් බවට පත් වුනා. ඔහුගේ කාටුන් නිර්මාණ චීනයේ පමණක් නොව අග්නිදිග ආසියාව පුරා ජනප්‍රිය වුනා.

එවක ආත්ම විශ්වාසය හීන ව තිබූ පිරිමි ළමයෙක් එවක පාසලේ දුර්වල ශිෂ්‍යයෙක් දැන් ඉතා සාර්ථක කාටුන් චිත්‍ර ශිල්පියෙක්. ඔහුගේ නම චු ද යෝං. අවුරුදු ගණනාවක් ගෙවී ගියා. මෑතදී චු ද යෝං විශ්ව විද්‍යාලයක දේශනයක් පවත්වද්දී කුඩා කාලයේ සත්වෝද්‍යානයේදී පියා කොටියා දෙස ඇඟිලි දිගු කරමින් තමාට කී වදන් සිහිපත් කළා:

'එදා මම මගේ පියාත් එක්ක සත්වෝද්‍යානයේ කොටියා නරඹද්දී පියා මට කරුණක් පැහැදිලි කළා. සතුන්ට වගේ මිනිසුන්ටත් විවිධ සහජ හැකියා තියෙනවා. කොටියා ශක්තිමත් සතෙක්. බළලා ගැන ඔයාලා දන්නවා නෙ. එයා කීකරු තීක්ෂණ සතෙක්. කොටියා තරම් බළලා ශක්තිමත් නැතත් මීයන් අල්ලන්න හා ගස් නගින්න වගේ ම කොටියාට නොතිබෙන සහජ හැකියා බළලාට තියෙනවා. හැමෝම කොටියෙකු වෙන්න කැමති වුනත් බොහෝ අයට තියෙන්නේ බළලාගේ හැකියාවන් විතරයි. එතකොට අවසානයේ ඒ අය අසමත් කොටියන් බවට පත් වෙනවා.

මම උපතින් අකුරුවලට සංවේදී නැති නමුත් චිත්‍රවලට ඉතා සංවේදී බව පියා මට එහිදී පෙන්වලා දුන්නා. මගේ පාසලේ ඉගෙනුම් කටයුතු දුර්වල වුනත් චිත්‍ර ඇඳීම පිළිබඳ මට තියෙන සහජ හැකියාව වර්ධනය කර ගන්න මට පුළුවන්කමක් තියෙනවා කියලා පියා මට කිව්වා. ඉතිං පියා කියලා දුන් අන්දමට මම අසමත් කොටියෙක් වුනේ නෑ. මම දැන් සාර්ථක බළලෙක්.'





# මැද සරත් උත්සවය

සෑම වසරකම 8වන චන්ද්‍ර මස 15වනදා, චීන සාම්ප්‍රදායික උත්සවයක් වන මැද සරත් උත්සවය සැමරේ. එය සාමාන්‍යයෙන් යෙදෙන්නේ සැප්තෙම්බර් හෝ ඔක්තෝබර් මාසයේදී ය. මෙම උත්සවයට මෙම නම ලැබුණේ සරත් සෘතුවේ මැද භාගයේ සැමරෙන බැවිනි. සරත් සෘතුවේ මැද භාගය උත්සවයක් වශයෙන් නිළ වශයෙන් සැමරීම ආරම්භ වූයේ ටාං රාජ පෙළපත් සමයේදී ය. චීනයේ වසන්ත උත්සවයට පමණක් දෙවැනි වන වැදගත්ම උත්සවයක් ලෙස මැද සරත් උත්සවය හඳුන්වනු ලැබේ. මෙම උත්සවයට වසර දහසකට අධික ඉතිහාසයක් හිමි ය.

මැද සරත් උත්සවයේ නාමය ලැබුණේ චීනයේ චන්ද්‍ර දින දර්ශනයට අනුව ය. චන්ද්‍ර දින දර්ශනයෙහි වසරක් සෘතු හතරකින් සමන්විත ය. සෑම සෘතුවකටම මුල, මැද සහ අග යන කොටස් තුනක් තිබේ. මැද සරත් සෘතුවේ රාත්‍රියේදී පුර සඳ බැබලෙයි. පුර සඳෙන් පවුලේ සාමාජිකයන්ගේ එකතු වීමේ අරුත සංකේතවත් වෙන බව චීන ජාතිකයන්ගේ විශ්වාසයයි. 8වන චන්ද්‍ර මස 15වනදා පවුලේ සාමාජිකයන් එකතු වීමේ දිනය වශයෙන් සැළකේ. ඒ නිසා මැද සරත් උත්සවය 'එකතු වීමේ උත්සවය' යනුවෙන් ද හැඳින්වෙයි.

## මැද සරත් උත්සවය පිළිබඳ සුරංගනා කතාව

'ඡං-අ' සඳට යාමේ කතාව

'ඡං-අ' යනු, දෙව්ලොවේ සිටි සුන්දර සුරඟනකි. දෙව්ලොවේ 'හෝයී' නමැති දක්ෂ දුනුවායාට ඇය පෙම් බැන්දා ය. 'ඡං-අ'ගේ සුන්දරත්වයට 'හෝයී' ආකර්ෂණය විය. දෙව්ලොවේ අධිරාජයාගේ අවසරයෙන් ඔවුන් දෙදෙනා විවාහ වී ප්‍රීතියෙන් තමන්ගේ ජීවිතය ගත කළහ.

එකල මෙලොව එළිය වූයේ එක් සූර්යයෙකුගෙන් පමණක් නොවේ. සූර්යයෝ දස දෙනෙක් මෙම කාර්යය කළහ. නමුත් එක ඉරක් පායා බැස යාමෙන් පසු අනෙක් ඉර අහසට නැඟිණ. සෑම අවස්ථාවකම අහසේ පායා තිබුණේ එක ඉරක් පමණි. එහෙත් හදිසියේම මෙම චර්යාව වෙනස් විය. මෙම සූර්යයෝ දස දෙනාම එකවර අහසට නැඟූනහ. මිනිසුන්ගේ සියලු වගාවන් දැවී හළු වී ගියේ ය. පණ රැක ගැනීමට සැඟවීම හැර වෙනත් කළ හැකි දෙයක් මිනිසුන්ට නොතිබිණ. මෙය දැන ගත් 'හෝයී'ට සූර්යයන් දස දෙනාගේ දඩබ්බර ක්‍රියාව ඉවසා දැරිය නොහැකි විය. ඒ නිසා ඔහු එයින් නව දෙනකු විද බිම හෙළීමට සමත් විය. කෝපයට පත් වූ දෙව්ලොවේ අධිරාජයා 'හෝයී' සහ 'ඡං-අ' දෙව්ලොවෙන් මෙලොවට පිටුවහල් කළේ ය. මෙලොවට පැමිණීමෙන් පසු, 'හෝයී' මිනිසුන් වෙනුවෙන් පව් කරන්නන් ඉවත් කිරීමෙහි වෙහෙසෙන්නට වූ නිසා, 'ඡං-අ' හුදකලා විය. ඇය නිරන්තරවම අසතුටින් සිටියා ය.

ඉදිරිපත් කිරීම : ෂාඕ ජී යං



ඇය සැනසීම සඳහා, 'හෝයී' කල්පනා කළේ පෑලදිග සුරපුරෙහි රැජිනට හිමි අමෘත ඖෂධය රැජිනගෙන් ලබා ගැනීමට ය. එය ලබාගත හැකි වුවහොත්, ඔවුන් දෙදෙනාට එක්ව සදාකාලිකව ජීවත් විය හැකි විය.

'හෝයී' මෙලොව මිනිසුන් වෙනුවෙන් පව් කරන්නන් ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම, පෑලදිග සුරපුරේ රැජිනගේ අනුකම්පාවට ලක් විය. ඇය දම් පැහැති අමෘත ඖෂධ ගුළි දෙකක් 'හෝයී'ට ත්‍යාග කළා ය. ඇය නැවත නැවතත් ඔහුට ප්‍රකාශ කළේ මෙම ඖෂධ ගුළි දෙක පානය කළ යුත්තේ 8වන මස 15වනදා රාත්‍රීයේ සඳ පූර්ණ වූ මෙහොතේදී බවයි. එක් අයකු දෙකම පානය කළහොත් මිය යනු ඇතැයි ද ඇය ඔහුට වැඩිදුරටත් පැවසුවා ය.

'හෝයී' ආපසු ගෙදරට පැමිණ මෙම අමෘත ඖෂධ ගුළි දෙක 'ඡං-අ'ට භාර දුන්නේ ය. එමෙන්ම, රැජිනගේ කතාව ඇයටත් කීය.

8වන මස 15වනදා උදෑසන 'හෝයී' නිවසින් පිටත් ව යෑමට පෙර, 'ඡං-අ' ඔහුට කල් ඇතිව නිවසට ආපසු එන ලෙස මතක් කළා ය. නමුත් රාත්‍රිය වන තුරු 'හෝයී' නිවසට ආපසු පැමිණියේ නැත. මහත් කණස්සල්ලට පත් වූ ඇය එම අමෘත ඖෂධ දෙකම පානය කළා ය.

'ඡං-අ'ගේ සිරුර සෙමින් සෙමින් සැහැල්ලු වීම ආරම්භ විය. ඇගේ සිරුර පෙළොවේ රඳවා ගත නොහැකි තරමට සැහැල්ලු විය. ඇය නිවසේ සිට අහසට පා වී ගියා ය. 'හෝයී' නිවසට ආපසු පැමිණි විට නිවසේ ඉතිරි වී තිබුණේ සිසිල් වූ දීසි පමණි. 'ඡං-අ' කොහේ ගියේ ද? අහසෙන් විහිද ආ අපැහැදිලි කටහඬක් ඔහුට ඇසිණ. ඔහු පිටතට ගොස් 'ඡං-අ' අහසේ පා වී ඈතට යන බව දුටුවේ ය.

අවසානයේදී, 'ඡං-අ' නැවතුණේ චන්ද්‍රයා මත පිහිටි ගුවංහන් නමැති මාළිගාවට සේන්දු වීමෙන් පසුව ය. ගුවංහන් මාළිගාවේ කිසිවකු සිටියේ නැත. එය අසල පිහිටා ඇත්තේ ඔස්මන්තස් මල් පිපී තිබෙන ගහක් පමණි. මෙම ගහෙන් සුවඳ විහිදෙමින් තිබිණ.

ඊළඟ වසරේ 8වන මස 15වනදා, ගුවංහන් මාළිගාවේ දොරටුවේ හිඳගෙන සිටි 'ඡං-අ' මෙලොව දෙස බැලුවා ය. මිදුලේ තැන්පත් කළ පූජාසනය අසල හිඳ 'හෝයී' කඳු' සලන හැටි ඇය දුටුවා ය. එදා සිට සෑම වසරකම 8වන චන්ද්‍ර මාසයේ 15වනදා රාත්‍රීයේ, 'ඡං-අ'ගේ හැඟුම්බර දෑස් බඳු සඳ වඩාත් දීප්තිමත් මෙන්ම සෞම්‍ය ලෙස පෙනෙන්නට පටන් ගත්තේ ය.



## මැද සරත් උත්සවයේ චාරිත්‍ර

සෑම චන්ද්‍ර මාසයකම 15වනදා පූර්ණ චන්ද්‍රයා දක්නට ලැබෙන නමුත්, වටකුරුම එමෙන්ම සුන්දරතම සඳ දැකිය හැක්කේ මැද සරත් උත්සවයේදී ය. සඳට පූජා පැවැත්වීම සහ සඳ දෙස බැලීම, මැද සරත් උත්සවයේදී කළ යුත්තකි. පවුලේ සාමාජිකයන් එක් වීමේ අභිලාෂය ඉන් විදහා දැක්වෙයි.

## මැද සරත් උත්සවයේ ආහාර චාරිත්‍ර

### සඳ කැවුම් අනුභව කිරීම

8වන චන්ද්‍ර මස 15වනදා පුර සඳ දැකිය හැකි අතර සුවඳ හා පැණිරසැති සඳ කැවුම් අනුභව කළ හැකි ය. සඳ කැවුම් මුලින්ම භාවිත කෙරුණේ සඳ දෙවියාට



පුදපූජා පැවැත්වීමේ ආහාරයක් වශයෙනි. ඉන් පසු, සඳ දෙස බලමින් සඳ කැවුම් අනුභව කිරීමෙන් පවුල් එකතු වීමේ අරුත ඉන් සංකේතවත් විය. දුවැන්වූ උත්සවයේදී 'ත්සොංස' සහ යුවාන්ෂාඕ උත්සවයේදී 'ටාංයුවාන්' මෙන්ම මැද සරත් උත්සවයේදී සඳ කැවුම් අනුභව කිරීම, චීනයේ දිගු ඉතිහාසයක් හිමි ජන සිරිතකි. සඳ බැබලෙන, ඔස්මන්තස් මල් සුවඳ විහිදෙන රාත්‍රීයේදී, පවුල් සාමාජිකයෝ සඳ දෙස බලමින් සමීපව කතා කරමින් සඳ කැවුම් අනුභව කිරීමෙන් ප්‍රීතිමත් රාත්‍රියක් ගත කරති. පවුලේ අය එකතු වීම සංකේතවත් වන සුබ සලකුණක් වශයෙන් සඳ කැවුම් සැළකේ.

### ඔස්මන්තස් මල්වලින් සෑදූ මත්පැන් පානය කිරීම

ඔස්මන්තස් මල් සුවඳට ඈතට විහිදී යා හැකි ය. ඔස්මන්තස් මල්වල උපන් බිම වන චීනයේ මෙම මල් වර්ගය වගා කිරීමේ ඉතිහාසය වසර 2500කට වඩා පැරණි ය. ජින් සහ හාන් යන යුග දෙකේදී, ඔස්මන්තස් මල් චීන ජාතිකයන්ගේ දැඩි අවධානයට ලක් විණ. මේ



වන විටත්, මෙම මල් කෙරෙහි දක්වන ලැදියාව දුර්වල වී නැත. ඔස්මන්තස් මල්වලින් මත්පැන් සෑදීමට ද දිගු ඉතිහාසයක් තිබේ.

සඳ මාළිගය අසලින් ඔස්මන්තස් මල් පිපී තිබෙන ගහක් පිහිටා තිබෙන බව කියැවෙයි. සෑම මැද සරත් දිනයකම රාත්‍රියේදී, පවුලේ අය එක් ව සඳේ ඔස්මන්තස් ගස දෙස බලති. ඔස්මන්තස් මල් සුවඳ විඳිමින් ඔස්මන්තස් මල්වලින් සෑදූ මත්පැන් පානය කරති. මෙම උත්සවය ප්‍රීතියෙන් ගත කරති.





# චීන ආර්ථිකය

# චීන සංචාරකයන් විදේශයන්හි සංචාරය කිරීමේදී ඔවුන්ගේ ප්‍රියතම සංචාරක අංග කවරේද ?

ඉදිරිපත් කිරීම : වාං යෝ යෝ





වසර 2023 වන විට චීනය ලෝකයේ පළමුවැනි සංචාරක ආර්ථික ඒකකය වනු ඇති බවට වසර 2014රේ පැවති ලෝක සංචාර සම්මේලනයේ මාධ්‍ය හමුවේදී ලෝක සංචාරක කර්මාන්ත කවුන්සලය තක්සේරු කළේය. එපමණක් නොව ඉදිරි වසර 10 තුළ ආසියාවේ සංචාරක කර්මාන්තයේ සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතය සියයට 5ත් 7ත් අතර ප්‍රමාණයට ළඟා වනු ඇති බවට ද සංචාරක කර්මාන්තය සමස්ත ආසියාව වෙනුවෙන් රැකියා අවස්ථා 4 කෝටි 70 ලක්ෂයක් සපයා දෙනු ඇති බවට ද අපේක්ෂා කෙරේ.

ඉදිරි වසර 5 තුළ විදේශයන්හි සංචාරය කරන චීන ජාතිකයන්ගේ සංඛ්‍යාව කෝටි 40 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කරන බව චීන ජාතික සංාචරක කාර්යාංශයේ නිලධාරියෙක් එම මාධ්‍ය හමුවේදී හෙළි කළේය. එමෙන් ම මෙම වසර තුළ චීනයේ සංචාරකයන්ගේ සංඛ්‍යාව කෝටි 330ක් ඉක්මවනු ඇති අතර චීනයේ සංචාරය කරන විදේශකයන් සංඛ්‍යාව කෝටි 15 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කරන බව ද ඔහු වැඩිදුරටත් සඳහන් කර තිබේ. චීන ජාතික සංාචරක කාර්යාංශය සැම විටම අන්තර් ජාතික සංචාරක හුවමාරු හා සහයෝගතා වැදගත් කොට සලකයි. මෙතෙක් චීන ජාතිකයන් සංචාරක කණ්ඩායම් ආකාරයෙන් සංචාරය කිරීමට හැකි විදෙස් රටවල් හා ප්‍රදේශ ගණන 150කට ළඟා වී තිබේ. චීනය, සෙසු රටවල් හා ප්‍රදේශ සමඟ ද්විපාර්ශ්වික ගුවන් ප්‍රවාහන ගිවිසුම් 110ක් පමණ අත්සන් කර ඇත. බොහෝ රටවල් හා ප්‍රදේශ චීන සංචාරකයන් වෙනුවෙන් වීසා ඉල්ලුම් වැඩපිළිවෙළ සරල කර ඇත.






චීන සංචාරකයන් විදේශයන්හි සංචාරය කිරීමේදී ඔවුන්ගේ ප්‍රියතම සංචාරක අංග කවරේ ද? දැනට එන්න එන්න ම වැඩි රටවල් මෙම ප්‍රශ්නය ගැන දැඩි රුචිකත්වයක් පවතී. එමෙන් ම එන්න එන්න ම වැඩි චීන සංචාරකයන් එම ප්‍රශ්නයට දෙන පිළිතුර වනුයේ භාණ්ඩ මිළදී ගැනීමයි. ඔවුන් ඇමෙරිකානු ඩොලර් බිලියන 70ක මිළදී ගැනීමේ බලයක් හිමි හමුදාවට සමාන යැයි අදාළ සංඛ්‍යාලේඛණයකින් පෙන්නුම් කෙරේ.ගත වූ වසර කිහිපය තුළ විදේශයන්හි චීන සංචාරකයන් ගණන කෝටි 10කි. ඔවුන්ගේ පරිභෝජන වටිනාකම ලෝකයේ පළමුවැනි ස්ථානයේ පසු වෙයි. උදාහරණයක් හැටියට,ලන්ඩන් නගරයේ ඈච්යරදඅ ගුවන් තොටුපළේ සංචාරකයන් තුළින් සියයට 1ක් පමණයි චීන සංචාරකයන් සිටින්නේ. එහෙත් එහි තීරු බදු රහිත භාණ්ඩ අලෙවි වටිනාකමින් සියයට 25ක් ඔවුන් විසින් නිර්මාණය කරන ලදී.







භාණ්ඩ මිළදී ගැනීම චීන සංචාරකයන් විදේශ රටවල සංචාරය කිරීමේදී ප්‍රියතම සංාචරක අංග බවට පත් වීමේ හේතු කවර ද? අදාළ සංඛ්‍යාලේඛණ වාර්තා අනුව ප්‍රධාන හේතු 2ක් තිබේ. එකක් , විදේශ රටවල තීරු බදු රහිත භාණ්ඩ මිළ චීනයේ එම භාණ්ඩයන්හි මිළට වඩා පහත වීමයි. සෙසු කරුණ වන්නේ, විදේශ රටවලදී විවිධාකාර ණය වරපත් භාවිත කිරීමෙන් අතිරේක අනුග්‍රාහී ලාභයක් ලබා ගැනීමයි.

චීන සංචාරකයන් විදේශ රටවල සංචාරය කිරීමේදී මිළදී ගන්නා භාණ්ඩ කවරේ ද? ලෝකයේ විශාලතම බදු මුදල් නැවත සැපයීමේ පද්ධතිය නිකුත් කළ සංඛ්‍යාලේඛණ වාර්තාවකට අනුව සුඛෝපභෝගී භාණ්ඩ, සිහිවටන සහ අධිතාක්ෂණ නිෂ්පාදිතයන් චීන සංචාරකයන් විදේශ රටවලදී මිළදී ගන්නා ප්‍රධාන භාණ්ඩ වෙයි. විශේෂයෙන් ම මෑත වසර කිහිපය තුළ එන්න එන්න වැඩි චීන සංචාරකයෝ විශේෂ ලක්ෂිත ප්‍රාදේශීය ආහාර වෙනුවෙන් මුදලක් වැය කරමින් සිටිති.

ඇත්ත වශයෙන් චීන සංචාරකයන් ආකර්ෂණය කිරීමේ ප්‍රධාන සාධක අතරින් අලංකාර සුන්දරත්වය සැම විටකම පළමුවැනි ස්ථානයේ පසු වෙයි. ඊට පහළින් ඒ ඒ විදේශ රටවල විශේෂ නාගරික සංස්කෘතිය වෙයි. එම නගරවල විශේෂ ඉතිහාසය, සංස්කෘතිය සහ ගොඩනැගිලි එන්න එන්න ම වැඩි චීන සංචාරකයන් ආකර්ෂණය කරමින් සිටී.







# පියාගේ සවලෙන් බිහි වූ චීනයේ අංක එකේ ධනවතා

චීනයේ සුන්දර හංජෝ නගරයේ පිහිටි බටහිර විල දෙසට බයිසිකලයෙන් නිතර එන තරුණයෙකි මා යුන් (Ma Yun). බටහිර විලේ සුන්දරත්වය නැරඹීමට විදේශිකයන් විශාල වශයෙන් පැමිණෙනවා. ඔවුන් හමු වී දන්නා ඉංග්‍රීසියෙන් කථා කරමින් මග පෙන්වන්නට ඒ හමබ පුරුදුවී සිටියා. ඒ නිසාම ඔහුට ඉංග්‍රීසි නමකුත් තිබුණා. ඒ තමයි ජැක් මා (Jack Ma). කොහොම නමුත් මුදලට වඩා ඉංග්‍රීසි භාෂාව ප්‍රගුණ කිරීමයි ඔහුගේ එකම අපේක්ෂාව වුණේ.

පාසලේ දී කිසිදු විශේෂ දක්ෂතාවයක් නොපෙන් වූ ජැක් මා ඉංග්‍රීසි විෂයට පමණක් තරමක් වැඩි ලකුණු ලබා ගත්තා. අපමණ දඟකාර හා හිතුවක්කාර වැඩ නිසාම ඔහුට වරින් වර පාසැල් තුනකටම මාරු වන්නට ද සිදු වුණා. සාමාන්‍ය පවුලක උපන් ජැක් මා ගේ පියා ප්‍රදේශයේ නාට්‍ය ශාලාවක සේවය කළ කෙනෙක්. නමුත් පුතාට කිසිම කළා හැකියාවක් තිබුණේ නැහැ. ජැක් මා ගේ අනාගතය ගැන මහා බියකින් පසු වූ මව දවසක් පියාගෙන් ඇහුවා "අපි මේ දරුවට මොකද කරන්නේ" කියලා. පියා අපූරු පිළිතුරක් දුන්නා. "මම කවදා හරි එයාගෙන් දක්ෂතාවක් මතු වෙන කම් එයා වටේට සවලක් අරගෙන හාරනවා,.

අඩුවක් නැති දඟ වැඩ නිසා පියා ජැක් මා ට බැන වැදුණු බොහෝ අවස්ථාවල ඔහු ඊට උත්තර දුන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. එක දවසක් පියා කිව්වා, "හරි මට ඉංග්‍රීසි නොතේරුණත් මම දන්නවා ඔයා මට බණිනවා කියලා. කමක් නෑ. තව ටිකක් හොදට ඉංග්‍රීසි ඉගෙන ගන්නකෝ."

ජැක් මා විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටි පළමු වර අසමත් වීම කාටවත් පුදුමයක් නෙවෙයි. ඒ නිසා පියා ආරක්ෂක අංශයේ රැකියාවක් සදහා සම්මුඛ පරීක්ෂණයකට ඔහුව යොමු කළා. එතරම් උස හෝ ප්‍රසන්න පුද්ගලයෙක් නොවුණු ඔහු ඉන් අසමත් වුණා.

ඊට පස්සේ පියා තම මිතුරෙකුගේ මාර්ගයෙන් පුවත්පත් සඟරා බෙදා හැරීමේ රැකියාවකට ඔහුව යොමු කළා. දිනපතාම බයිසිකලයෙන් ඉතා දුර බැහැර ප්‍රදේශ වලට යමින් වෙහෙස මහන්සියෙන් ඔහු රැකියාව කරගෙන ගියා. ජැක් මා ගැන හැමවිටම විමසිලිමත් වූ කෙනෙක් වූයේ නම් ඒ ඔහුගේ පියා. එක දවසක් පියා මෙහෙම කිව්වා, ඔයාට මෙච්චර මහන්සිවෙලා මේ රැකියාව කරන්න පුළුවන් නම් ඇයි බැරි ඒ තරම් මහන්සිවෙලා දෙවෙනි පාර විභාගෙ කරන්න. ජැක් මා ඒ අදහසට එකඟ වුණා. ගණිතයට අදක්ෂ පුතාට ගුරුවරයෙක් ගෙදරට කැදෙව්වා. ජැක් මා සෑහෙන උත්සාහයකින් විභාගයට ඉදිරිපත් වුණා. අවසනාවට ඔහු දෙවන වරත් විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය අසමත් වුණා.

පියා කිව්වේ තුන් වන වරටත් විභාගේ කරන්න කියලා. පවුලේ සියලූ දෙනා ඊට විරුද්ධ වුණා. නමුත් පියා උපරිමයෙන් ඔහුට උදව් කරා. ගුරුවරු කිහිප දෙනෙකුම නිවසට කැදවා ජැක් මා ට ඉගැන්වුවා. නමුත් එවරද ඔහු අසමත් වුණා. ඒ කෙසේ නමුත් එවර හංජෝ ගුරු විශ්ව විද්‍යාලය ට ප්‍රමාණවත් සිසුන් පිරිසක් නොවුණ නිසා අඩු ලකුණු ලැබූ කීප දෙනෙකුට විශ්ව විද්‍යාල වරම් හිමි වුණා. ඒ අතරට පූරුවෙ වාසනාවකට වගේ ජැක් මා ද ඇතුලත් වුණා.

පාසල් කාලයේ ඔහු තුල නොතිබුණු දැඩි උනන්දුවක් විශ්ව විද්‍යාලයේදී දක්නට ලැබුණා. ඉතා ක්‍රියාශීලී දක්ෂ දීප්තිමත් ශිෂ්‍යයෙකු වූ ජැක් මා ට පසුකාලීනව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සභාපති ධුරයද හිමි වුණා.

හැම විටම අලූත් අදහස් වලට ඉඩ දුන් ජැක් මා හංජෝ නගරයේ ඉංග්‍රීසි උපකාරක පංතියක් පටන් ගත්තා. ඔහු නගරයට ප්‍රථම වරට ඍබටකසිය සඳරබැර නම් වූ ඉංග්‍රීසි භාෂා පුහුණු ආයතනයක් හඳුන්වා දුන්නා. විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසු එහිම ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස

රැකියාව ආරම්භ කළ ඔහු කරන දේ උපරිමයෙන් ඉටුකරන්න පුරුදු වී සිටි නිසා හංජෝ නගරයේ දක්ෂම ගුරුවරුන් 10 දෙනා අතරට තේරී පත් වී සම්මාන හිමි කර ගත්තා. ඒ අතර විශ්ව විද්‍යාලයේ ප්‍රේමය මල්ඵල ගන්වමින් චන්ග් ඉන් (Zhang Ying) සමඟ විවාහ වුණා. රැකියාව අතරතුර ඔහුට ඇමෙරිකාවේ සංචාරයකට අවස්ථාවක් ලැබුණා. එහි දී ඔහු හඳුනාගත් අපූරුපුදුම දෙයක් වේ නම් ඒ අන්තර්ජාලයයි. ඔහු යළි චීනයට පැමිණි පසු චීනයේ සමාගමකට ඇමෙරිකානු මිතුරෙක්ගේ සහායෙන් වෙබ් අඩවියක් නිර්මාණය කර දුන්නේ ඉතා දැඩි සතුටකින්.

ජැක් මා දුර දක්නා ඥුවනකින් කටයුතු කිරීම ඔහු තුළ තිබුණු විශේෂ ලක්ෂණයක්. ඔහු හිතුවා ගුරු වෘත්තියට සමු දී තමාගේම ව්‍යාපාරයක් පටන් ගන්න. සේවකයන් 11 දෙනෙකුගෙන් සමන්විත භාෂා පරිවර්තන සේවා ආයතනය ඇරඹුණේ ඒ විදිහට. එය සිතූ තරම් ලෙහෙසි පහසු එකක් වුණේ නැහැ. මාසිකව ඔහුට ලැබුණු චීන යුවාන් 500 ක ආදායමෙන් සේවා ස්ථානයේ මාසික කුළිය වූ චීන යුවාන් 700 ක් පියවා ගැනීමටවත් නොහැකි වුණා. ඉතිරි යුවාන් 200 උපයා ගත්තේ චීනයේ දුර බැහැර වෙළඳ නගර වලට ගිහින් බඩු වෙළදාම් කිරීමෙන්. ඒ වන විට ඔවුන්ගේ පවුලට තුන්වැන්නෙක් ද එකතු වී සිටියා. ඔහුගේ බිරිද කියන විදිහට ඔවුන් ඉතා අසීරු වසර 3ක් මේ විදිහට ගත කළා. ඇය ද රැකියාවක් කරමින් සිටි නමුත් විවාහයෙන් පසු ඇය බලාපොරොත්තු වූ පරිදි සතුටුදායක සැහැල්ලු ජීවිතයක් ඔවුන්ට හිමි වුනේ නැහැ. ඒ කෙසේ නමුත් ඔවුන්ගේ ව්‍යාපාරය තරමක් සාර්ථක වනවාත් සමඟම ජැක් මා ට අලුත් සිතුවිල්ලක් පහළ වුණා. සිතූ සැනින් යමක් වෙනස් කිරීම ඔහුගේ උපන් ගතියක්. ඒ අනුව ඔහු භාෂා පරිවර්තන ආයතනය යහළුවෙකුට පවරා අලුත් ව්‍යාපාරයකට යොමු වුණා. ඔහු මුලින්ම තම මිතුරන් කිහිප දෙනෙකුගෙන් යුවාන් 50,000ක් ණයට ගත්තා. මිතුරනුත් හවුල් කරගෙන e-Business හෙවත් අන්තරජාල වෙළද සමාගමක් ආරම්භ කළා. එහිදි ඔහු මිතුරන් ඉදිරියේ අවංකවම කිව්වේ අපේ සමාගම සාර්ථක වුනොත් ලොකු ආදායමක් ලබා ගන්න පුළුවන්. හැබැයි අසාර්ථක වුනොත් ඔයාලා මට දුන්න යුවාන් 50,000 වත් ආපහු දෙන්න බැරි වෙනවා කියලා. මේ කතාවට බිය නොවූ මිතුරන් ජැක් මා සමඟ සමාගම පටන් ගත්තා.

ස්වාමියා හැම විටම ජීවිතයේ ගන්නා විවිධ තීරණ නිසා බිරිඳගේ හිතේනම් නිතරම තිබුණේ අනාගතය ගැන බියක් සහ අවිනිශ්චිත බවක්. දිවා රෑ නැතිව ඔහු ව්‍යාපාරයට පණ දුන්නා. ඔහුට අලූත් අදහසක් හිතුනු සැනින් දුරකථනයෙන් මිතුරන් කැදවා දීර්ඝව ඒ ගැන සාකච්ජා කළා. නිවසට පැමිණෙන 10 ක් 15 ක් මිතුරන් වෙනුවෙන් කෑම බීම පිළියෙල කළේ බිරිඳ විසින්. දුම්වැටි මත්පැන් සමඟ සිදු කෙරෙන සාකච්ජා සමහර විට මධ්‍යම රාත්‍රිය පහු වී අලුයම දක්වා දීර්ඝ වෙනවා. නිවසේ තමන්ගේ කුඩා දරුවට හැදෙන්න වැඩෙන්න සුදුසු පරිසරයක් තිබුණේම නැතිතරම්. වැඩිහිටියන් කන දෙයක් මිස දරුවට සුදුසු කෑමක් හදන්න බිරිඳට වෙලාවක් ලැබුණේ නැහැ. එහි ප්‍රතිපලයක් විදිහට දරුවා මන්ද පෝෂණයෙන් පෙළුණා. නමුත් ක්‍රමයෙන් e-Business ව්‍යාපාරය සාර්ථක වෙමින් තිබුණා. ජැක් මා බිරිදට කිව්වා දැන් ඔබ රැකියාවෙන් ඉවත් වෙලා අපේ සමාගමත් එක්ක එකතු වෙන්න කියලා.



සුපුරුදු විදිහට ඇය ඔහුගේ තීරණයට එකඟ වුණා. ඒ අනුව ඇයට සමාගමේ ඉහළ තනතුරක් ලැබුණා.

දැන් ඔවුන් දෙදෙනාම තව තවත් කාර්ය බහුල නිසා දරුවා පාසැල් නේවාසිකාගාරයේ නැවැත්වුවා. සති අන්තයේ පමණක් ගෙදර එන්න අවස්තාව ලැබුණත් වයස අවු. 10 ක් වූ පුතා එය ප්‍රතික්ෂේප කළා. ඔහු කිව්වේ කවුරුත් නැති ගෙදරට එනවට වඩා පරිඝණකයේ සෙල්ලම් කරන එක හොදයි කියලා.

ජැක් මා ගේ දරුවා පරිඝණක ක්‍රීඩා වලට තදින්ම ඇබ්බැහි වී සිටියා. මේ නිසා අධ්‍යාපනයට ද ඉතා දුර්වල වුණා. දෙම්ව්පියන් සහ දරුවා අතර සම්බන්ධය දුරස් වීම එයට හේතු වී තිබුණා. ඒ වන විට ජැක් මා ගේ ඇ-ඊම්සබ්ස් ව්‍යාපාරයේ සාර්ථකත්වය හේතුවෙන් ඔහුට මිල මුදල්, ජයග්‍රහණ,සම්මාන රැසක් හිමි වී තිබුණා. නමුත් දරුවා සම්බන්ධයෙන් ඔවුන් ලබා ඇති පරාජය තේරුම් ගත් ජැක් මා බිරිඳට කිව්වා වහාම රුකියාවෙන් ඉවත් වෙන්න කියලා. ජීවිතේ සියලු අසීරුතාවන් වලදී කැප කිරීම් කළ බිරිඳ එම ඉල්ලීමට එකඟ වුණා. ඇය සම්පූර්ණයෙන්ම ගෙදර දොරේ කටයුතු කරමින් දරුවාගේ සියලූ කටයුතු වෙනුවෙන් කැප වුණා. මේ අතර ජැක් මා පරිඝණක සෙල්ලම් වලට ඇබ්බැහි වූ දරුවා ඉන් මුදා ගැනීමේ මෙහෙයුම දියත් කරන්න පටන් ගත්තා. එක පාසැල් නිවාඩු කාලෙක ඔහු පුතාට මෙහෙම කිව්වා,

මම ඔයාට යුවාන් 200ක් දෙනවා. ඔයා මේ සල්ලි වලින් ඇති වෙනකම් එක දිගට දින ගණනාවක් වුණත් පරිඝණක සෙල්ලම් කරලා ගෙදර එන්න. හැබැයි ඊට පස්සේ මම අහන ප්‍රශ්ණෙට උත්තර දෙන්න ඕනි. පුතා ඊට එකඟ වෙලා සල්ලිත් අරගෙන ගියා. දින 3කට පස්සේ ඔහු ගෙදර ආවා. ඒ සැනින්ම බඩපිරෙන්න කෑම කෑවා. ඔහු දැඩි වෙහෙසකින් හා නිදිමතකින් සිටි නිසා ඊළඟට නිදා ගත්තා. මේ නිසා සෑහෙන වෙලාවකට පසුවයි ඔහු පියා මුණ ගැහුණේ. ඒ වෙලාවේ පියා ඔහුගෙන් ඇහුවා ඔයාට පරිඝණක සෙල්ලම් කරලා ලබා ගන්න පුළුවන් වුණු වාසි මොනවද කියලා. පියාගේ ප්‍රශ්ණය හමුවේ ඔහු නිරුත්තර වුණා. ඔහු කිව්වා වාසි මොකුත් නෑ, හොදටම මහන්සි, හරීම නිදි මතයි, මුළු ඇඟම රිදෙනවා කියලා.

කාලය ගත වුණා. ක්‍රමයෙන් දරුවා විසින්ම පරිඝණක සෙල්ලම් නතර කළා. ජැක් මා ගේ බිරිඳ සියලූ ආකාරයෙන් දරුවාට මග පෙන්වීමේ කටයුතු කළා. මාස 6කින් පසු ඔහුගේ අධාපන මට්ටමේ සැලකිය යුතු වෙනසක් සිදු වුණා. දියණියක ලැබීමෙන් පසු ජැක් මා ගේ පවුල තවත් සම්පූර්ණ වුණා. අද වන විට ජැක් මා ගේ පුත් ඒ ශම්බනමබ ඇමෙරිකාවේ විශ්ව විද්‍යාලයක උසස් අධ්‍යාපනය හදාරමින් සිටිනවා. සෑම සාර්ථක පිරිමියෙකු පසු පස කාන්තාවක් සිටී යන චීනයේ ඉතා ජනප්‍රිය කියමන සපථ කළ ජැක් මා ගේ බිරිඳ තම ස්වාමීයාව ගැන ඉතා ඉහළින් අගය කරනවා. මගේ ස්වාමියා කඩවසම් කෙනෙක් නොවුනත් කඩවසම් පිරිමින්ට කළ නොහැකි බොහෝ දේ ඔහුට කළ හැකි යැයි ඈ පවසන්නේ නිහතමානි ආඩම්බරකමකින්.

ජැක් මා හදුන්වා දුන් අන්තර්ජාල වෙළද සමාගම චීනය පුරා ජනප්‍රිය වෙමින් ඉහළ ආදායම් වාර්තා තබන්නට සමත් වුනා. ජැක් මා අලූත් අලූත් සංකල්ප ඔස්සේ ව්‍යාපාරය පුළුල් කරමින් දෙස් විදෙස් ජයග්‍රහණ රැසක් ද අත්කර ගත්තා. ලෝක ආර්ථික සමුළුව විසින් 2005 වසරේ තරුණ ගෝලීය නායකයා ලෙස ඔහුව නම් කළා. එම වසරේ දීම ආසියාවේ බලගතුම ව්‍යාපාරිකයන් 25 දෙනා අතරට ද ජැක් මා තේරී පත් වුණා. 2007 දී බිස්නස් සඟරාවේ වසරේ ව්‍යාපාරිකයා ලෙස ජැක් මා තේරුණා. 2008 දී ලෝකයේ හොදම ප්‍රධාන විධායක නිළධාරීයා ලෙස මෙන්ම තවත් සම්මාන රැසක් දිනා ගැනීමට ජැක් මා සමත් වුණා. මේ වන විට ජැක් මා ගේ අලිබබා සමාගම ඇමෙරිකානු කොටස් වෙළද පොළට ඇතුලත් වී හමාරයි. 2013 වසරේ දී හොංකොං හී විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයෙන් ජැක් මා ට ගෞරව ආචාර්ය උපාධියක් ද හිමි වුණා. ඔහු ලොව ප්‍රකට විශ්ව විද්‍යාලවල දේශන පැවැත්වීම සදහා සහභාගී වීමද විශේෂත්වයක්. ඔහු දැන් 50 වන වියේ පසු වනවා. අද වන විට චීනයේ අංක 1 ධනවතා බවට පත් වුණේ එක රැයකින් නොව අසීරුතා රැසක් පසු කරමින් ආ මඟක් ඔස්සේ බව ජැක් මා සිහිපත් කරන්නේ ඉතා සතුටින්.



ඉදිරිපත් කිරීම : අනෝජා දිසානායක



# පාට පහේ වීවලින් ගොවි ආදායම ඉහළයයි

වර්තමානයේ මිනිසුන් ගේ ජීවන මට්ටම ක්‍රමයෙන් ඉහළ නැංවෙයි. මීට පෙරධාන්‍ය පිළිබඳ අවබෝධය වූයේ කුස පුරවා ගැනීම පමනි. එහෙත්, වර්තමානයේ මිනිස්සු ධාන්‍ය පිළිබඳ රසපෝෂණය හා සෞඛ්‍යය පවත්වාගෙන යෑම යනාදි අංශ පිළිබඳව ද වැදගත් කොට සලකයි. මෑත වසර තුළ විශේෂ සහල් චීන ජනතාවගේ කැමැත්තට ලක් ව තිබේ.

වෙළඳ පොළේ අව්‍යශතාව සපුරාලීමට මෙන්ම ගොවියන් ගේ ආදායම් වැඩිකිරීම සඳහාත් චීනයේ චොංචිංහි ජියැන්චුන් ස ජෛව කෘෂිකර්මාන්ත සංවර්ධන සමාගම පස් පාටැති වී වර්ග වගාකිරීම ආරම්භ කර තිබේ.

නිරිත දිග චීනයේ චොං චිං නගරයේ නන්චු ආන් දිස්ත්‍රික්කයේ හ ශා ගම්මානය දිස්ත්‍රික්ක මට්ටමේ දිළිඳු ගම්මානයකි. එම ගම්මානය කඳුකර ප්‍රදේශයේ පිහිටා තිබේ. ගමේවැසියෝ ආවේනික වී වගා කිරීමෙන් හා ඌරන් ඇති කිරීමෙන් ජීවත්වෙති. වසර 2014 දී හ ශා ගම්මානයේ සමස්ත ජනගහනයෙන් එක් පුද්ගලයෙකුගේ වාර්ෂික ශුද්ධ ආදායම් යුඅැන් 2500කි.

හශා ගම්මානයේ ප්‍රවාහන පහසුකම් දුර්වල නමුත් යහපත් ජෛව පරිසරයක් තිබෙන බව මෙම ගම්මානයේ අධ්‍යක්ෂ චොව්සූ ලිං මහතා පැවසීය.

හශා ගම්මානයට අලංකාර කඳු හා ජල සහ සරු ගොවිබිම් සම්පත් හිමිවේ. එවගේම අවට පරිසරයේ රසායනික දූෂණයක් ද නොමැත. ගම්මානයේ වයස අවුරුදු 90කට වැඩි වැඩිහිටියන්ගේ සංඛ්‍යාව 18කි.

යහපත් පරිසරය ආකර්ෂණයකි. වසර 2015 හේ පෙබරවාරි මාසයේ චොංචිංහි ජියැන්චුන් ස ජෛව කෘෂිකර්මාන්ත සංවර්ධන සමාගම එම ගම්මානයට ගොස් නිරීක්ෂණයක් කළේ ය. එම සමාගම හ ශා ගම්මානයේ යහපත් ස්වාභාවික පරිසරය සොයා ගත්තේ ය. පස්පාටැති වී වගාකිරීම සුදුසු බව අනතුරුව ඔවුන් තීරණයකර තිබේ.

පස්පාටැති වී කළු, රතු, කහ, කොළ සහ තඹ යන ස්වාභාවික පාටපහෙන් සමන්විත වී වර්ගයකි. එම වීවල කිසිදු දූෂිත බවත් හා හානියක් නොමැත. ඒ වගේම පෝෂ්‍යදායී ය. රසවත් ය.

එම වී වර්ගය ආරම්භවූයේ ශැන්සී පලාතේ හා චෝනගරයේය. වසර 2015ට පෙර චොංචිං ප්‍රදේශයේ පස්පාටැති වී වගා නොකෙරුණේ බව ජියැන්චුන් ස සමාගමේ අධ්‍යක්ෂවරයා පැවසීය.

ජියැන්චුන් ස සමාගම ෂොවියුආන් කොටස් සංගමය ස්ථාපිත කළේ ය. සමාගම ගම්මානයේ හෙක්ටයාර 2ක අත්හදාබැලීමේ ඉඩම්වල පස්පාටැති වී වගාකරයි.









එමෙන්ම ගම්මානයේ ගොවියන් තමන්ගේ කැමැත්ත අනුව ප්‍රථම වගාකිරීම ආරම්භකර තිබේ. ජියැන්චුන් ස සමාගම ගොවියන්ට බීජ, පොහොර, කෘමිනාශක සහ තාක්ෂණික උපදේස් නොමිලේ ලබාදෙයි. ගොවියන් වගාකරන සමස්ත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 8කි.

හශා ගම්මානයේ ගොවියෙකු චොව්ටැංරෝ වර්ග මීටර් 2000ක පස්පාටැති වී වගාකර තිබේ. ඔහු සඳහන් කළ පරිදි, වර්තමාන වගාවේ තත්වය අනුව, තමාගේ ඉඩම්වල වගා කල වීවලින් සහල් කිලෝග්‍රෑම් 1200ක් ලබා ගත හැකි ය. ජියැන්චුන් ස සමාගම, සහල් කිලෝග්‍රෑමයක්, යුඅැන් 4.4කට මිලදී ගනී. සාමාන්‍ය වී වගා කළොත් සහල් කිලෝග්‍රෑමයක ආදායම් යු ඇන් 2.4කි. එහෙයින් පස්පාටැති වී වගා කිරීමෙන් සාමාන්‍ය වී වගාකිරීමට වඩා වැඩි ආදායමක් ලබා ගත හැකි ය.

පස් පාටැති සහල් ලංජනයක් රාඅලෙවිකිරීමට සූදානම් කරනබව ජියැන්චුන් ස සමාගමේ නිළධාරියෙක් පැවසීය. වගාකරන පස්පාටැති වීවල භූමි ප්‍රමාණය තවදුරටත් ව්‍යාප්ත කරනු ඇතිබව ඔහු කීවේ ය. හ ශා ගම්මානයේ වැසියන් විශාල පිරිසකට එයින් සෘජු ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවන බව ද ඔහු සඳහන් කළේ ය.



ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං



# චීන සමාජ ජීවිතය

# ගයන්න බැරි නම් බඳින්න බැරිවන ෂා ජාතිකයෝ

චීනයේ ජීවත්වන සියළු සුළු ජාතිකයන් හට එකිනෙක ජාතීන් අතරින් පැහැදිලිව වෙන් කොට හඳුනා ගත හැකි අනන්‍යතා ලක්ෂණ පවතී. චීනයේ අග්නිදිග පැත්තට වන්නට පිහිටි ෂජියෑන් පලාතේ වැඩිදුර වෙසෙන ෂා ජාතිකයන් සතු එක් සුවිශෙෂත්වය වනුයේ බොහෝ වැදගත් අවස්ථාවලදී ගායනය උපයෝගී කර ගැනීමයි.

ෂා ජාතික ජනගහණය හත්ලක්ෂ නවදහසකට අධික බව මෑත සංඛ්‍යාලේඛණ හෙළි කරයි. ඔවුන් ෂජියෑන්, ජියැන් සි ග්වදොං යන පලාත්වල විසිරී සිටිති. සමූහ වශයෙන් එක්ව නිවාස මන්ඩියක එසේ නැතහොත් හැන් ජාතිකයන්ගේ වාසස්ථාන සමඟ ඔවුන් ජීවත් වෙති.

බහුතරයන් ජීවත් වනුයේ කඳුකර ප්‍රදේශවලයි. ගංගාව, කඳු, සරුසාර පොළව, සෞම්‍යකාලගුණය, අධික තෙතමනය සහිත වාතාශ්‍රය ඔවුන්ගේ ජීවිතවලට බොහෝ සමීපය. මේනිසා කෘෂිකාර්මික ජීවිනෝපායකට ෂා සුළු ජාතිකයන් පොළඹ වනු ලැබ තිබේ. වී, ධානය, අර්තාපල්, දුම්කොළ ඔවුන්ගේ වගාවන්ගෙන් කීපයකි. ඇතැම් ඖෂධීය පැලෑටි, උණ බම්බු, තේ සහ රටකජු ඔවුන්ගේ වාණිජ වැවිලි අතරින් කැපී පෙනෙයි. තඹ, ඇලුමිනියම්, රත්රන්, ගල් අඟුරු, ග්‍රැෆයිම්, ගෙන්දගම්, ටැල්කම් ආදී ඛණිජ ද්‍රව්‍ය ද ඔවුන් ජීවත්වන ප්‍රදේශවල දක්නට ලැබේ.

ඔවුන්ගේ භාෂාව චීනයේ තවත් ප්‍රධාන සුළු ජන කොටසක් වූ හැන් ජාතිකයන්ගේ භාෂාවට සමානය නමුත් වර්තමාණයේ බොහෝ ෂා ජාතිකයන් කථා කරනුයේ චීන භාෂාවයි. ග්වංදොංග් පලාතේ වෙසෙන ෂා ජාතිකයන් මාවෝ ජාතිකයන්ට සමාන භාෂාවක් කථා කරති.

ෂා ජාතිකයන් සහ ගීතය අතර පවතිනුයේ ආත්මීය බැඳීමකි. ගොවි බිමේදී ද විශේෂ උත්සව අවස්ථාවලදී ද ඔවුහු ගී ගයති. ගී ගෑයීම සඳහාම වූ උත්සව ඔවුන් අතර වාර්ෂිතව සංවිධාන වෙයි. ඔවුන්ගේ ගීත අතර විශේෂත්වයක් ගනුයේ කථාන්දර ගීතයි. ගීතයේ ආරම්භයේ සිට අවසානය දක්වා දිග කථාවක් කීම මේ ගිතවල ස්වභාවයයි. ෂා සුළු ජනවර්නයේ සුවිශේෂී ජන නිර්මානයක් ලෙස මෙම කථාන්දර ගීත හැඳින්වෙයි. ෆුජියෑන් පලාතේ, හුන්නාන් නගර අසන්න ප්‍රදේශය ෂා ගෝත්‍රිකයන් බහුලව ජීවත්වන පලාතේ. මෙම පාලතේ ජීවත්වන්නන් අතර තවමත් ෂා සුළු ජාතික සංස්කෘතියේ නෂ්ටාවශේෂ දැකිය හැකි වෙයි. ඔවුන් අතර තවමත් මෙම කථාන්දර ගීත පවතී. වර්තමානයේ දී මේ ගී පදමාලා අතර ට වෙනත් ජාතිකයන්ගේ කථා ද මුසු වී තිබෙනු දක්නට ලැබෙයි. බොහෝ විට මොවුන්ගේ ගීතයේ එන කථාන්දරය තම ගෝත්‍රයේ පෙර විසූ වීරයෙකු පිළිබඳ විය හැකිය. එම වීරයා සතුරා පරාජය කළ ආකාරය නාට්‍යමය වශයෙන් ඒ තුළ නිරූපනය වෙයි. වසර 1644-1911 චිං පෙලපතේ සිට මෙම කථාන්දර ගීත පැවත එන බව විශ්වාස කෙරේ. කෙසේ වුවද චින්ග් පෙළපතේ අවසානයන් සමඟ සිදු වූ වෙනස්කම් මත කථන්දර ගීත ව්‍යාප්තිය නතර වී තිබේ.

ඔවුන්ගේ පැරණි විවාහ සිරිත්වල ගීත ගායනය යොදා ගැනීම ඉතා සුන්දර අවස්ථාවකි. ෂා ජාතික විවාහය පෙර පැවැති පරිදි දෙමාපිය යෝජනාවකින්, මඟුල් කපුවකු හරහා සිදුවන්නකි. මෙය ඇතැම් විට රූමත් දියණියක් විකිණීමකට සමාන වෙයි. වැඩවසම් යුගයේ ක්‍රියාත්මක ඉඩම් හිමිකාරිත්වය අනුව සළකා බැලූ විට විවාහ යෝජනාවක් සම්මත කරගැනීම ඉතා සුපරීක්ෂාකාරී කටයුත්තකි. බොහෝ විට දිළිඳු ගොවියෙකුට තම පුත්‍රයා වෙනුවෙන් "විවාහයේ මිළ" ගෙවීමට නොහැකි විය. ප්‍රේමබන්දන විවාහ මගින් අද මේ තත්වය වෙනස් වී තිබුණද අතීතයේ එය ප්‍රබල ආර්ථික නටෂත්තකි. මනාලියට දැවැදි වශයෙන් ලැබෙනුයේ කෘෂ්කාර්මික ආම්පන්න, උණ බම්බු, වැහි කබා සහ තොප්පි වැනි දේය.

ඔවුන්ගේ විවාහ මංගල උත්සවය සරළය. පළමු ව මනාලයා සහ ඥාතීන් භෝජන සංග්‍රහයක් සඳහා මනාලියගේ නිවසට පැමිණෙයි. ඔවුන් නිවස තුලට පැමිණෙන විට ඇත්තේ හිස් කෑම මේසයකි. අනතුරුව ආහාර කෝටුවල සිට සියල්ල රැගෙන ඒ සඳහා මනාලයා ගීයෙන් ඇරයුම් කළ යුතුය. භෝජන සංග්‍රහය අවසානයේදී හිස් බඳුන් ආපසු රැගෙන යාම සඳහා ද මනාලයාට ගීයක් ගයා දැනුම් දිය හැකිය. ආහාර පිසින්නා ද තම අනන්‍යතාව විදහා දක්වමින් තමන්ට ආවේනික ශෛලියකින් පිලිතුරු ගී ගැයීමද මෙහිදී දක්නට ලැබේ.

ඇතැම් තැනෙක මනාලයා ගම්මානයට පිවිසෙන විටද ගම් දොර අබියස සිට ගීත ගයා ගමට ඇතුල්වීමට අවසර ඉල්ලීමත් දක්නට ලැබේ. ඒවිටද ඔහුට පිළිතුරු ලැබෙන්නේ ගීයකි. විවාහ අවසන් වනුයේ මනාල යුවල ඉදිරිපිටින් සියලූ දෙනාම එකම ගීතයක් ගයමින් නිවසේ දොරටුව වෙත ගමන් කිරීමෙන්. එවිට මනාලයාගේ දෙමව්පියන් නිවසේ දොරටුව අභියස සිට මනමාලියගේ පාර්ශවයට භෝජන සංග්‍රහයක් සඳහා ආරාධනා කරයි. මේ අනුව ෂා ගෝත්‍රයේ මනාලයෙකු වීමට ගායක හැකියාව අනිවාර්ය බව පෙනේ.

සෑම ගෝත්‍රිකයෙකුම මකර හිසක් ඇති සැරයටියක් දැරීම සාම්ප්‍රදායික ලක්ෂණයක්. මෙය ඔවුන්ගේ ගෝත්‍රික විශ්වාසය හා බැඳී තිබේ. පුරාණසේ නිතර ගෝත්‍ර අතර සටන් පැවතියේය. සතුරු ප්‍රහාර උත්සන්න වෙත්ම ගෝත්‍රික නායකයා අසරණ විය. සතුරා මරා හිස ගෙන එනු ලබන පුද්ගලයාට තම රූමක් දියණිය සරණ පාවා දෙන බව වරක් එක් ගෝත්‍ර නායකයෙක් ප්‍රසිද්ධ කළේය. අවසානයේ සුනඛ සිරුරක් ඇති "පන්නූ" නම් පුද්ගලයෙක් ඉදිරිපත් විය. ඔහු සතුරා මරා ගෝත්‍රික නායකයාගේ දියණිය විවාහ කර ගත්තේය. ඔවුන්ට දරුවන් තුන් දෙනෙකු ලැබිණ. තමන් පැවත එන්නේ ඔවුන්ගෙන් බව ෂා ගෝත්‍රිකයෝ විශ්වාස කරති.

චීන මහජන සමූහාණ්ඩුව බිහිවී අධ්‍යාපන අවස්ථා සුලබ වන තෙක්ම මෙම ෂා ජාතිකයන් අවතාර සහ භූතාත්ම පිළිබඳ දැඩිසේ විශ්වාස කළ බව කියැවේ.

අතීත ෂා ජාතිකයන් ගත කළේ දඩයම් දිවිපෙවෙතකි. ඔවුහු දඩයම් කිරීමට වනන්තර ගත වීමේදී දඩයම් දෙවියකු පිළිබඳ විශ්වාස කළෝය. ඔවුන් එම දෙවියන්ගේ සංකේතය ලෙස සැලතුවේ විශාල ගල්පර්වත බෑවුමකි. තම දඩයමෙන් කොටසක් එම බෑවුමට විසිකිරීමෙන් ඔවුන් දඩයම් දෙවියන්ට පූජා පැවැත්වූ බව කියැවෙයි. මළවුන් සිහිකිරීම ඔවුන්ගේ සුළභ චාරිත්‍රයක්. සෑම වසරකම ජෙබරවාරි ජූලි සහ අගෝස්තු මාසවල මැද දිනයක දීත් චීන චන්ද්‍ර මාස ක්‍රමයේ තුන්වන මාසයේ තුන්වන දිනය ඔවුන්ගේ මළවුන් පිදීමේ දිනය ලෙස හැඳින්වේ. මලගිය ඥාතීන් සිහිකර වයින් වීදුරු 2ක්, තේ කෝප්පයක් සහ ව්‍යාංජන රක් සහින ආහාර වෙලක් වෙන්කිරීම ඔවුන්ගේ සිරිතයි. මිය ගිය ඥාතීන් සිහි කරන උත්සව දිනයේදී ඔවුන් තමන් අනුභව කරන බත්, කළු පැහැග න්වයි. ඒ සඳහා කිසියම් ශාක සාර විශේෂයක් සහල් වලට එකතු කිරීම ඔවුන්ගේ සිරිතයි. මුතුන් මිත්තන් වෙනුවෙන් පුද පූජා පැවැත්වීම ආරම්භ වනුයේ මෙම කලූ පැහැති බත් අනුව කිරීමෙන් පසුවයි.

නව වසර උදාවීමත් සමඟ එකිනෙකාට සුභපැතීම අප අතර ද පවතින සිරිතකි. නමුත් ෂා ජාතිකයන් එසේ එකිනෙකාට සුභපැතීම ආරම්භ කරනුයේ අවරුදු උදාවෙන් පස්වන දිනයේ සිටයි. එසේ කිරීමට විශේෂ හේතුවක් ඔවුන්ගේ ප්‍රරාවෘතවල සඳහන් වී තිබෙනවා.

එක්තරා කලක කිසියම් පුද්ගලයකුට නව වසර උදාවේ තම මව්පියන් බැලීමට යාමට සිත් විය. නමුත් එදින හටගත් දැඩි උදරාබාධයක් නිසා ඔහුගේ ගමන වැළිකී ගියේය. ඔහු පසු දිනයේදී උත්සාහ කළේය. නමුත් උදරාබාධය සුවවී නොතිබින. මේ ආකාරයට ඔහුට මේ ගමන යාම සඳහා මඳ හෝ සුවයක් දැනුනේ අවුරුද්ද උදාවී දින පහක් ගත වූ පසුය. ඒත් එදා අතර මඟදී ඔහුගේ බඩේ රුදාව යළි මතු විය. මේ නිසා ඔහු අසලවූ වන ලැහැබකට රිංගා ගත්තේය. අවසානයේදී ඔහුගේ එක් පාවහනක් මඩ වගුරකට වැටිණ. ඔහු එය සොයන්නට උත්සහ කළේය. මඩ වගුරින් මතු











වූයේ රන් සපත්තුවකි. පසුව මෙම පුද්ගලයා එම රන් සපත්තුව විකුණා විශාල ධනවතකු විය. මේ ඉතිහාස කථාව විශ්වාස කරන ෂා ජාතිකයෝ තවමත් අලුත් අවුරුදු නැගම් යන්නේ අවුරුද්දේ පස්වන දිනය පසුව විටය.

ඔවුන්ගේ අවමංගල උත්සව අවස්ථාවලදී අසල්වැසි නිවෙස්වලින් මළගෙදරට අවශ්‍ය සහල් ලබාදීම සිදු වෙයි. එම සිරිත ඇරඹෙන්නටද හේතු වන පුරාණ කථාන්දරයක් ඔවුන් අතර වෙයි. ගමේ පොදු වැඩවලට නොමසුරුව උපකාර කරන එක්තර මහළු මිනිසකු ඔවුන්ගේ ගමක වාසය කර තිබේ. ගමේ තිබූ ඒ දණ්ඩක් අලුත්වැඩියා කරද්දී ඔහු ගඟට වැටී මිය ගියේය. අසල් වැසියෝ ඔහුගේ නිවසට එකතු වූහ. එම මහළු මිනිසා ගමම සේවය කලා විනා තමන්ට කිසිවක් උපයාගෙන නැති බව අසල්වැසියන්ට වැටහින. ඔවුහු නිවෙස්වලින් සහල් සම්මාදම් කර එම අවමඟල් උත්සවය පැවැත්වූහ. මෙතැන් සිට අවමංගල නිවසකට අසල්වැසි ආධාරය හිමි වීම සිරිතක් බවට පත්වූ බව කියැවෙයි.

කුඩයක් නිවස තුල දිගහැර නැවීම අශුභ දෙයක් ලෙස ෂා ජාතිකයෝ සිතති. සාමාන්‍යයෙන් නිවස තුල කුඩයක් දිගහැර තබනුයේ එම නිවසේ මරණයක් සිදුවූ විටය. මේ නිසා ඔවුන් හැම විටම අමුත්තෙකුගේ නිවසට ඇතුළු වනවිට තම කුඩය එම නිවස තුලට රැගෙන නොයති. එය නිවස අද්දර ස්ථානයක තැබීම ඔවුන්ගේ සිරිතයි.

ෂා සුළු ජාතිකයෝ බොහෝ සිරිත් මිථ්‍යා මත හෝ කථා මත පදනම් වුද එවයේ අපූර්ව සුන්දරත්වයක් හා අන්යෝනය මිත්‍රත්වය ගොඩනැංවෙන අපූර්වත්වයකි ගැබ්ව තිබෙන බව සිතෙයි.







ඉදිරිපත් කිරීම : චන්දන තිලකරත්න සහ චෙන් ගුවැන් වන්



# 2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය බෙයිජිංවලට ලැබෙයි



මෙම වසරේ ජූනි මස 31වනදා ජාත්‍යන්තර ඔලිම්පික් කොමිසමේ රැස්වීමක් මැලේසියාවේ ක්වාලා ලුම්පූර් අගනගරයේදී පැවැත්විණ. 2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළලේ සත්කාරකත්වය චීනයේ බෙයිජිං අගනගරයට ලැබූ බව ජාත්‍යන්තර ඔලිම්පික් කොමිසමේ සභාපති බාහ මහතා එහිදී ප්‍රකාශ කළේ ය. ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙල චීනයේදී පැවැත්වෙන ප්‍රථම අවස්ථාව මෙයයි. ඒ අනුව බෙයිජිං නගරය ග්‍රීස්ම හා ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙල දෙක ම පැවැත්වීමේ වරම් ලබන ලොව ප්‍රථම නගරය බවට පත් වෙයි.

ඇත්ත වශයෙන් ම, 2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය සඳහා නගර 2ක් පමණක් තරග කර තිබේ. බෙයිජිං හැර අනික් නගරය වන්නේ කසකස්තානයේ අල්මාටි අගනගරයයි. මෙවර තරගයට එක් වූ නගර වන බෙයිජිං හා අල්මාටි ඇතුළුව සත්කාරකත්වය සඳහා රටවල් හයේ නගර 6ක් තිබිණ. අනෙක් නගර 4 වන්නේ ස්වීඩනයේ ස්ටෝක්හෝම්, පෝලන්තයේ ක්‍රාකොව්, යුක්රේනයේ ලිවොව් සහ නෝරවේ ඔස්ලෝ. කෙසේ වෙතත්, විවිධ හේතූන් නිසා මේ නගර 4 පිළිවෙළින් තරඟයෙන් ඉල්ලා අස් විය.

ඔස්ලෝ නගරය මෙවර තරගයෙන් ඉවත් වීමෙන් පසුව බෙයිජිං, 2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය අත්පත් කර ගනු ඇති බවට බොහෝ අය අනාවැකි පළ කර තිබිණ. කුමක් නිසා ද, ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් හෝ පවත්වා නොමැති අල්මාටි නගරයට සාපේක්ෂව, බෙයිජිං නගරයට වාසි රැසක් හිමි වන බැවිනි. 2008 ග්‍රීස්ම ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වීම මගින් ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් පැවැත්වීමේ සාරවත් අත්දැකීම් බෙයිජිං ලබා ගත්තේ ය.










මීට අමතරව, 2008 ග්‍රීස්ම ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ඉදි කෙරුණු ක්‍රීඩාංගන රැසක් යළි භාවිත කළ හැකි ය. ඉන් අදහස් වෙන්නේ 2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා බෙයිජිං නගරය වැය කරන මුදල් විශාල වශයෙන් පිරිමසා ගැනීමට හැකි බවයි. තව ද, ඔලිම්පික් ව්‍යාපාරයට චීන රජය සහ ජනතාව ස්ථිර ලෙස අනුබල දීම බෙයිජිං නගරයට හිමි වන තවත් වාසියකි.

බෙයිජිං නගරය ශීතල ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය හිමි කර ගැනුණද 2022 ශීතල ඔලිම්පික් ක්‍රීඩා උළල පවත්වන එකම චීන නගරය බෙයිජිං නොවෙයි. බෙයිජිංවලට උතුරින් පිහිටි චාංජ්‍යාකොව් නගරය බෙයිජිං සමඟ ඒකාබද්ධව මෙවර ක්‍රීඩා උළෙල පවත්වයි. චාංජ්‍යාකොව් නගරයට වනන්තර සහිත කඳු වැටි හිමි වීම හේතුවෙන් හිම සපත්තු දමාගෙන ඇවිදීම වැනි හිම මත සිදු කෙරෙන ක්‍රීඩා ඉසව් එහිදී පැවැත්විය හැකි ය.

බෙයිජිං සහ චාංජ්‍යාකොව් අතර දුර ප්‍රමාණය කිලෝමීටර් 200ක් පමණ වෙයි. 2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙලට සහභාගි වන ඒ ඒ රටවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ සංචාරකයන්ගේ පහසුව පිණිස මෙම නගර දෙක සම්බන්ධ කර ප්‍රවාහන පහසුකම් යහපත් කිරීමට චීන රජය පියවර ගෙන තිබේ. මේ වන විට අධිවේගී මහා මාර්ග කිහිපයකුත් අධිවේගී දුම්රිය මාර්ගයකුත් ඉදි කිරීමේ කටයුතු ආරම්භ වී ඇත.

ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙල 2022 වර්ෂයේ පෙබරවාරි මස 4වනදා සිට 20වනදා දක්වා පැවැත්වීමට නියමිත ය. ඒ කාලය හරියට ම චීනයේ අලුත් අවුරුදු කාලයයි. ඒ හේතුවෙන් එහි සමාරම්භක උත්සවය අලුත් අවුරුදු තේමා කර ගෙන පැවැත්වෙනු ඇතැයි බොහෝ අය විශ්වාසය පළ කර ඇත.

2022 ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩාංගන හා ක්‍රීඩා පිටි 12ක් යොදා ගැනේ. ඒ අතරින් 3ක් පමණක් අලුතින් ඉදි කිරීමට පියවර ගැනේ. ඒ නිසා මෙවර ක්‍රීඩා උළෙල මුදල් අරපිරි මැස්මෙන් වැය කරන ක්‍රීඩා උළෙලක් බව චීන රජය පවසයි.

කෙසේ වෙතත්, අඩු වර්ෂාපතනයක් සහිත බෙයිජිං සහ චාංජ්‍යාකොව් හිම මත සිදු කෙරෙන ක්‍රීඩා ඉසව් පැවැත්වීමට සුදුසු නැද්ද යන්න පිළිබඳව ඇතැම් අය සැකය පළ කර තිබේ . ඇත්තට ම, බෙයිජිං සහ චාංජ්‍යාකොව් පිහිටා ඇත්තේ උතුරුදිග චීනයේ අඩු වියළි කලාපයේ ය. බෙයිජිං නගරයේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 500ක් පමණ වන අතර චාංජ්‍යාකොව් නගරයේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 350ක් පමණි. ඉන් අදහස් කෙරෙන්නේ ශීත සෘතු ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ එළිමහන් ඉසව් සඳහා ප්‍රමාණවත් හිම හිඟ විය හැකි ය. මෙවැනි අයහපත් තත්ත්වයක් මතු වූවහොත් ඊට මුහුණ දීමට ද චීන රජය පියවර ගෙන තිබේ. ඒ නම්, කෘත්‍රිම වර්ෂාපතනය ඇසුරින් හිම ප්‍රමාණය වැඩි කිරීමයි. කෙසේ වෙතත්, ඔලිම්පික් ක්‍රීඩා උළෙලවල් 2ක් සාර්ථක ව පැවැත්වූ චීනයට තවත් ඔලිම්පික් ක්‍රීඩා උළෙලක් පැවැත්වීමට හැකියාව හා ශක්තිය තිබෙන බවට අනාවැකි පළ කළ හැකි ය.





ඉදිරිපත් කිරීම : හැන් ජියැන්



# චාඔ ටියැන් වෙයි ගේ
# කෝපි අවන්හල




වර්තමානයේ චීනය නිර්මාණ යුගයට ප්‍රවේශ වෙලා තිබෙනවා. චීනයේ මිනිසුන් විශේෂයෙන් චීනයේ තරුණයන් තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂා කරනවා. 'චාඔ ටියැන් වෙයි', චීනයේ බෙයිජිං අගනුවර වාසය කරන සාමාන්‍ය අයෙක්. ඔහුත් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අපේක්ෂාවක් තිබෙනවා.

'චාඔ ටියැන් වෙයි' කෝපි අවන්හලක් විවෘත කරන්නට තීරණය කළා. මීට පෙර ඔහු ගුවන් විදුලියේ සංස්කාරකයෙක්. එහි ඔහු අවුරුදු හතක් වැඩ කළා. කෝපි අවන්හලක් විවෘත කිරීම සඳහා ඔහු එතනින් ඉල්ලා අස් වුනා. මාධ්‍ය කටයුතුවලට කැමති කියලා 'චාඔ ටියැන් වෙයි' අවංක ලෙස කිව්වා, නමුත් තරුණයෙක් වශයෙන් තමා කරන්න කැමති දේවල් වැඩියෙන් අත්හදා බලන්න ඕන කියලා ඔහු හිතුවා. ඒ නිසා මෙම තීරණය ගැන ඔහු කනගාටු වුණේ නැහැ.

ඔහු බෙයිජිං අගනුවරේ හඔහයි ප්‍රදේශයේ බැඩැර එයැ ක්ෑ නම් කෝපි අවන්හලක් විවෘත කළා. මුලින් ඔහු විවිධාකාර දුෂ්කරතාවලට මුහුණ දුන්නා. සේවකයන් කුලියට ගන්න බැරි නිසා මුලින් 'චාඔ ටියැන් වෙයි' තනිවම කෝපි අවන්හලේ වැඩ කළා. එතකොට ඔහුට කෝපි හදන්න විදිය ඉගෙන ගන්නත් ඕන. ඒ වගේම මුදල් හිඟය ඒ කාලයේ විශාලතම ප්‍රශ්නය වූ බව 'චාඔ ටියැන් වෙයි' හෙළි කළා. සමහර විට චීන යුවාන් කිහිපයක් කොහොම ද වියදම් කරන්න කියලා ඔහුට කල්පනා කරන්න සිදු වුනා. කෝපි අවන්හල ආරම්භ වූ වසරේ සීත සෘතුවේ දවසක් 'චාඔ ටියැන් වෙයි' තනිවම අවන්හලේ හිටියා. අමුත්තෝ කවුරුවත්ම හිටියේ නැහැ. එම තනිකම අද දක්වා තවම මතක තියා ගන්න පුළුවන් කියලා ඔහු කිව්වා, නමුත් මුලින් තමා මෙම මාර්ගය තොරා ගත් නිසා දැන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතු බව ඔහු හිතුවා. වියදම් අඩු කිරීම සඳහා අවන්හලේ සියලු වැඩ ඔහු තනිවම කළා.




අද දක්වා අවුරුදු තුනක් පුරා 'චාඔ ටියැන් වෙයි'ගේ කෝපි අවන්හල සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නිතරම ආපු අමුත්තෝ දැන් ඔහුගේ යාළුවන්ට පත් වෙලා තිබෙනවා. ඔවුන්ට සතුටු වුනා හෝ අසතුටු වුනා හෝ 'චාඔ ටියැන් වෙයි'ගේ කෝපි අවන්හලට ඇවිත් ඔහු සමග කතා කරන්න කැමතියි. විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යාවන් කිහිප දෙනෙක් උපාධි ලබා ගෙන බෙයිජිං අගනුවරින් පිටත් වුනාට කලින් 'චාඔ ටියැන් වෙයි'ගේ කෝපි අවන්හලට පැමිණියා. ඔහුගේ කෝපි අවන්හලට කැමති කියලා ඔවුන් කිව්වා.

ඒ වගේම මෙම කෝපි අවන්හල ඔවුන්ගේ මතක අතර කොටසක් බවට පත් වෙලා කියලා ඔවුහු 'චාඔ ටියැන් වෙයි' කිව්වා. මෙම කථා ඇසුන විට 'චාඔ ටියැන් වෙයි' හොඳටම සතුටු වුනා.



'චාඔ ටියැන් වෙයි'ට කෙරෙහි කෝපි අවන්හල විතරක් නොවෙයි, එහිදී යාළුවන් හම්බ වීමක් සතුටට හේතුවක්. යාළුවන් දුකිස් සිටින විට ඔවුන්ට ගෙදර වගේ ස්ථානයක් සපයන්න පුළුවන් නම් සෑහීමකට පත් වෙන්න පුළුවන් කියලා 'චාඔ ටියැන් වෙයි' හිතනවා.

පරිශ්‍රමයක් දරා මොනවා හරි ආපසු ලබා ගන්න පුළුවන් කියලා 'චාඔ ටියැන් වෙයි' විශ්වාස කරනවා. ඔහුගේ සිහිනය තවමත් සැබෑ වෙලා නැහැ කියලා ඔහු හිතනවා. අනාගතයේ තවත් උත්සාහ දරමින් තමාගේ කෝපි අවන්හල දියුණු කර ගත යුතුයි. මුදල් ඉපයීම සඳහා නොවෙයි, තමාගේ සිහිනය දිනා ගැනීම සඳහා තමාගේ ව්‍යාපාරය ආරම්භ කළ බව ඔහු කිව්වා. ඒ වගේම වැදගත්ම අරමුණ වන්නේ වෙනත් ආකාරයක ජීවිතයක් ආරම්භ කිරීම බව ඔහු සඳහන් කළා.






ඉදිරිපත් කිරීම : බූ යුන්

# ජී පී ආර් එස් සහිත කුණු බාල්දිය



කුණු බාල්දි කැළිකසල පිරුණු විට ඒ බව ජී පී ආර් එස් යන්ත්‍ර මගින් පරිසර සුරක්ෂිත මධ්‍යස්ථානයට හා සේවකයන්ට දැනුම් දීම විද්‍යුත් ප්‍රබන්ධ කථාවක් නොවෙයි. එය නොබෝ කාලයකින් චීන ෂැංහයි නගරයේ ඇත්තටම සිදු විය හැකිය.

පසුගිය වසරේ චීන ෂැංහයි රජය නිකුත් කළ 2014-2016 වසර බුද්ධිමය නගරික සංවර්ධන සැලැසුමට ජී පී ආර් එස් යන්ත්‍ර සහිත කුණු බාල්දිය යොදා ගැනීම ඇතුළත් කර තිබේ. මහජන දිශානතියේ ලෝක ඉහල මට්ටම බුද්ධය නගරයක් සංවර්ධනය කිරීමේ තේමාව යටතේ මෙම සැලැසුම නගරයේ පරිසරය සුරක්ෂිත කිරීම හා කැළිකසල පාලන ක්ෂේත්‍රයන්හි බුද්ධිමත්ව පාලනය කිරීමට අවධාණය යොමු වී තිබේ.

ෂැංහයි නගරයේ නගරික පලිපාලන හැකියාව හා අරක්ෂාව නංවා ගැනීම වෙනුවෙන් නගර පලිපාලිනය, ආහාර අරක්ෂාව, පරිසර සුරක්ෂිත කිරීම හා ජනතා අරක්ෂාව යන ක්ෂේත්‍රවල තොරතොරු තාක්ෂණය යොදා ගත තිබේ. ජී පී ආර් එස් සහිත කුණු බාල්දිය පිළිබදව අධික තාක්ෂණ වැඩසටහන් එකකි. දත්ත චිපය සහිත මෙම කුණු බාල්දියේ විදුලි සැපයුම සූර්ය බැටරිය විසිනි.

අපද්‍රව්‍ය පාලන අංශය අදාල දත්ත සැම වෙලකම දැන ගත හැකිය. ඉන් පසු අපද්‍රව්‍ය තිබේන ස්ථාන ආසන ප්‍රදේශයේ ධාවන කෙරෙන කසල ප්‍රවාහන රිය හා වීදි පිරිසිදු රථයට මෙම තත්ත්වය දැනුම් දිය හැකිය. මෙම බුද්ධිමත් ක්‍රමය මගින් අපද්‍රව්‍ය පාලන අංශයට වේගයෙන් හා පහසුවෙන් අදාල අපද්‍රව්‍ය වර්ගීකරණය හා පාලනය කළ හැකිය.

මෙම ජී පී ආර් එස් සහිත කුණු බාල්දිය නිෂ්පාදිත ෂංහයි ඕතු සමාගම මාධ්‍යවේදින්ට ප්‍රකාශ කළේ අපද්‍රව්‍ය පාලන අධි තාක්ෂණය ඇමෙරිකාව වසර කිහිපයකට පෙර යොදා ගත් බවයි. බුද්ධිමය නගරය පිළිබද පරිසර සුරක්ෂිත පහසුකම් නිෂ්පාදන කිරීම හා අදාල තාක්ෂණය ලෝකයේ පළමු ස්ථානයක පවතින්නේ ඇමෙරිකාවේ බව ඕතු සමාගම නිලධාරියෙක් පැවසීය. එමෙන්ම අපද්‍රව්‍ය වර්ගීකරණය කෙරේ සාමාන්‍යයෙන් ජනතාවට හොඳ අවබෝධය තිබීම හේතුවෙන් ඇමෙරිකාවට අපද්‍රව්‍ය පාලනය යහපත් ප්‍රතිඵල ලබා දි තිබේ. විශේෂයෙන්ම ඇමෙරිකා අපද්‍රව්‍ය පාලන සමාගම වයි ෆයි සහිත කුණු බාල්දිය නිෂ්පාදනය කර තිබේ. නිව්යෝක් නගරයේ මහ මාර්ගවල මෙම වර්ගයේ වයි ෆයි සහිත කුණු බාල්දි සවි කර ඇත. මහ මග පයින් ගමන් කරන්නට පහසුවෙන් වයි ෆයි සේවය ලබා ගත හැකිය.

ජාත්‍යන්තර මහා නගරයක් ලෙස ෂැංහයි නගරය අනාගතයේදී බුද්ධිමය නගරයක් ලෙස සංවර්ධනය කළ යුතු බව වාර්තා කර තිබේ. නව තාක්ෂණය යොදා ගනිමන් තොරතොරු සම්පත් එක්තු කිරීම, නගර පාලනය නව පද්ධතියක් ඉදි කිරීම මගින් නගරය නව පාලන ව්‍යුහයකට පත් වීම අඛණ්ඩව සංවර්ධනය කළ හැකි බව බුද්ධිමය නගරයේ ප්‍රධාන කරුණු වෙයි. එම විද්‍යුත් යටතේ පරිසර සුරක්ෂිත කිරීම ඉතා වැදගත් බව විශේෂඥයෝ පෙන්වා දි තිබේ. ජී පී ආර් එස් හෝ වයි ෆයි සහිත කුණු බාල්දිය යොදා ගැනීම පමණක් නොව විවිධ වර්ග නාගරික අපද්‍රව්‍ය හරිත ක්‍රමයෙන් පරිපාලනය කළ යුතු බවට බුද්ධිමය නගරයේ අවධාණය යොමු වෙයි.

අපද්‍රව්‍ය වර්ගකරණය, පවිත්‍රකරණය, වළ දැමීම හා දවා අලු කිරීම යන කටයුතු නව තාක්ෂණය මත හරිත පද්ධතියක් ඇති වනු ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට බුද්ධිමය නගරය සැලසුමක් තිබේ. එම සියළු පියවර ශැංහයි ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීමට ඉවහල් වනු ඇති බව විශ්වාස කෙරේ.










ඉදිරිපත් කිරීම : සුන් ජියා ජියා



# ෆූදැන් විශ්ව විද්‍යාලය

බෙයිජිං, චීන්හුආ වැනි චීනයේ ප්‍රකට විශ්ව විද්‍යාල මෙන්, ෆූදැන් විශ්ව විද්‍යාලය ද බොහෝ චීන ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ ශුද්ධ ස්ථානයක් ලෙස සැලකෙන විශ්ව විද්‍යාලයකි. වාර්ෂික ව පැවැත්වෙන ජාතික උසස් විභාගයේදී චීනය පුරා වැඩිම ලකුණු ලත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මේ විශ්ව විද්‍යාලයට ඇතුල් වී එය මනා ව සනාථ කරයි.

ෆූදැන් විශ්ව විද්‍යාලය වර්ෂය 1905දී ශන්හයි නගරයේ පිහිටුවනු ලැබීය. ශන්හයි නගරයෙහි ප්‍රකට විශ්ව විද්‍යාල බොහොමයක් පිහිටා තිබේ. එහෙත් විශිෂ්ට අධ්‍යාපන ගුණාත්මකභාවයක්, ඉතා දක්ෂ ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් සහ චීන ඉතිහාසයේ හිමි වන සුවිශේෂී ස්ථානයක් හේතුවෙන් ෆූදැන් විශ්ව විද්‍යාලය සෙසු විශ්ව විද්‍යාල අතරින් කැපී පෙනේ.

චීන ජාතිකයන් තමන් විසින් ම ඉදි කරන ලද පළමු විශ්ව විද්‍යාලය ෆූදැන් විශ්ව විද්‍යාලයයි. පසුගිය සියවසේ මුලදී ආර්ථික සහ දේශපාලන අර්බුදයන් මෙන් ම බටහිර රටවල බලපෑම් ද හේතුවෙන් බිඳ වැටීමේ අවදානමකට චීනය මුහුණ පා සිටියේ ය. අර්බුදවලින් සිය පාලනය බේරා ගැනීමේ අරමුණින් එකල චීනයේ ඇතැම් උගතුන් අධ්‍යාපනයට ප්‍රතිසංස්කරණ හඳුන්වා දී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ෆූදැන් විශ්ව විද්‍යාලය බිහි විය.

ෆූදැන් විශ්ව විද්‍යාලයේ බිහිවීම පිළිබඳව කථා කරද්දී අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතු පුද්ගලයෙක් සිටී. ඔහුගේ නම මා ෂ්‍යාං බ. ඔහු චීන නූතන ඉතිහාසයේ ප්‍රකට ම අධ්‍යාපනඥයෙකි. ඔහු ෆූදැන් විශ්ව විද්‍යාලයේ පළමු කුලපති ධුරයට පත් විය. විශ්ව විද්‍යාලයේ විවිධ කටයුතුවලට ඔහු ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්නේ ය.

එම ප්‍රතිසංස්කරණ නිසා එම කාලයේ චීනයේ විශිෂ්ට ම ප්‍රාඥයන් බොහෝ දෙනෙක් ෆූදැන් විශ්ව විද්‍යාලයට පැමිණියහ.

මා ෂ්‍යාං බ මහතා කුලපති ධුරය හෙබවූ කාලපරිච්ඡේදය ෆූදැන් විශ්ව විද්‍යාලයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙයි. එම කාලය ෆූදැන් විශ්ව විද්‍යාලය ශාස්ත්‍රීය වශයෙන් ඉතිහාසයේ හොඳම කාලයයි. සමාජවාදය හෝ ධනවාදය හෝ ඇතුළු විවිධ මතවාද එහි පැවතීමට අවස්ථාව ලබා දී තිබේ. එසේ ම, අධ්‍යාපනයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට ද මා ෂ්‍යාං බ මහතා කටයුතු කර තිබිණ.

මා ෂ්‍යාං බ මහතා හඳුන්වා දුන් විවිධ ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන්, ෆූදැන් විශ්ව විද්‍යාලය අධ්‍යාපන සංකල්පයෙන් නූතන සහ විෂයෙන් පරිපූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත් විය. ෆූචැන් විශ්ව විද්‍යාලයේ සම්ප්‍රදාය බිහි වූයේ මා ෂ්‍යාං බ මහතාගේ ධුර කාලයේ බව බොහෝ දෙනා පිළි ගත්හ.

පසුගිය සියවසේ 20 දශකයේදී ප්‍රජාතන්ත්‍රවාදය සහ විද්‍යාව තේමා කර ගත් සංස්කෘතික ව්‍යාපාරයක් උගතුන්ගේ නායකත්වයෙන් චීනයේ සිදු විය. බටහිර බලවතුන්ගේ ආධිපත්‍යයෙන් රට මුදා හැරීමට බටහිර ප්‍රජාතන්ත්‍රවාදය හා විද්‍යාව මඟින් චීනය ප්‍රතිසංස්කරණය කළ යුතු බව එකල බොහෝ චීන උගතුන්ගේ අදහස විය.

එම ව්‍යාපාරයට ෆූදැන් විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද දායකත්වය ලබා දී තිබිණ. උගතුන් හා තරුණයන් තමන්ගේ ම ඉරණම රටේ ඉරණම සමඟ එකට සම්බන්ධ කළ යුතු බව ෆූදැන් විශ්ව විද්‍යාලයේ උරුමයක් බවට පත් විය.


ඉදිරිපත් කිරීම : හැන් ජියැන්











ෆුදැන් විශ්ව විද්‍යාලය ලෝකයේ විශිෂ්ට ම විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීමට චීන රජය අපේක්ෂාවෙන් සිටී. ඒ හේතුවෙන් ෆුදැන් විශ්ව විද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා අනුග්‍රාහී ක්‍රියාමාර්ග රාශියක් චීන රජය ක්‍රියාත්මක කර ඇත. ඒ සමඟ ම, ඒ විශ්ව විද්‍යාලයේ විවිධ කටයුතු සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. දැනට එය ශාස්ත්‍ර, තාක්ෂණ, වෛද්‍ය විද්‍යාව ඇතුළු පීඨ 28කින් සමන්විත පරිපූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත් ව තිබේ.

ඊට අමතරව, සාමාන්‍ය උපාධියට අමතරව, ෆුදැන් විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි පිළිබඳ ඉගැන්වීම් ද දේශීය ඉහළ මට්ටමක පවතී. එමෙන් ම, ෆුදැන් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර ස්ථානය ද ඉහළ යාමේ ප්‍රවණතාවක පවතී. ලෝක විශ්ව විද්‍යාල පිළිබඳව විදෙස් ආයතනයක් නිකුත් කළ නවතම නම් ලැයිස්තුවට අනුව, චීනයේ විශ්ව විද්‍යාල අතරින් ෆුදැන් විශ්ව විද්‍යාලය හතරවන ස්ථානයේ පසු වෙයි.

ෆුදැන් විශ්ව විද්‍යාලය පිළිබඳව දැන් ඔබ තුළ යම්කිසි දැනුමක් ඇති විය හැකි ය. චීනයේදී උසස් අධ්‍යාපනය ලබන්නට හිතු වුවහොත් ෆුදැන් විශ්ව විද්‍යාලයට පැමිණෙන්න.

ෆුදැන් විශ්ව විද්‍යාලය පිළිබඳ සවිස්තර තොරතුරු සඳහා මේ වෙබ් අඩවියට පිවිසෙන්න.

http://www.fudan.edu.cn





# චීන භාෂාව



# 打 电 话 - දුරකථන ඇමතුමක් ගැනීමේදී

## 今 日 关 键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 喂，刘 经 理 在 家 吗？ | වෙයි ලිව් ජිංලි සයි ජියා මා? |
| | හෙලෝ ? මැනේජර් ලියු ගෙදර ඉන්නවා ද? |
| 他什么时候回来？ | තා ෂන්ම ශිහවු හුයිලයි? |
| | ඔහු කොයි වෙලාවට ද ආපහු එන්නෙ? |
| 请他给我回个电话。 | චිං තා ගෙයි වෝ හුයිග දියැන්හුවා. |
| | කරුණාකරලා ඔහුට කියන්න මට ආපසු දුරකථන ඇමතුමක් දෙන්න. |

## 对 话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 喂，刘 经 理 在 家 吗？ | වෙයි ලිව් ජිංලි සයි ජියා මා? |
| | හෙලෝ ? මැනේජර් ලියු ගෙදර ඉන්නවා ද? |
| 他不在家。 | තා බු සයි ජියා. |
| | මැනේජර් ලියු ගෙදර නැහැ. |
| 他什么时候回来？ | තා ෂන්ම ශිහවු හුයිලයි? |
| | ඔහු කොයි වෙලාවට ද ආපහු එන්නෙ? |
| 我也不知道。 | වෝ යේ බු චීතව්. |
| | මමත් දන්නේ නැහැ. |

## 对 话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 请他给我回个电话。 | චිං තා ගෙයි වෝ හුයිග දියැන්හුවා. |
| | කරුණාකරලා ඔහුට කියන්න මට ආපසු දුරකථන ඇමතුමක් දෙන්න කියලා. |
| 好的。 | හඔද. |
| | හොඳයි. |
| 我的电话是87654321 | වෝද දියැන්හුවා ෂ පා චී ලියු වු ස සන් ආර් යී. |
| | මගේ දුරකථන අංකය 87654321. |
| 好的。我一定转告他。 | හඔද, වෝ යීදිං චුවන්ගඕ තා. |
| | මම එයට කියන්න මයි. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

චීන ජාතිකයන් "ඉරට්ටේ" සංඛ්‍යා වලට දක්වන්නේ දැඩි ලැදියාවක්. ඒ අතරිනුත් අංක අට ඔවුන්ට සුවිශේෂී අංකයක්. චීන භාෂාවේ "පොහොසත් වෙනවා" යන අදහස සහිත "发(fā) 财(cái)" යන ශබ්දයට සමාන හඩකුයි අංක අටට චීනෙන් කියන්නෙත්. ඒ තමයි "පා" ඒ වගේම" සුමුදු "යන අදහස සහිත "ලියු "කියන ශබ්දයෙන් හඳුන්වන අංක හයටත් චීනයේ ඇත්තේ ඉහළ තැනක්. ඒ විශේෂයෙන් මංගල කටයුතු වලදී. හැබැයි අවමංගල එහෙම නැත්නම් මරණය කියන අදහස කියැවෙන 死(sǐ) ශබ්දයෙන් හැඳන්වෙන අංක 4 ට නම් චීන ජාතිකයන් තුළ ඇත්තේ දැඩි අකමැත්තක්.





# 谈 论 他 人 - අන් අය ගැන කථා කිරීමේදී

## 今 日 关 键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 你 妹 妹 是 做 什 么 的？ | නී මෙයිමෙයි ෂ චුවෝ ෂන්ම ද? |
| | ඔයාගේ නංගී මොනවද කරන්නේ ? |
| 你 觉 得 她 怎 么 样？ | නී චුවෙද තා සන්මයන්? |
| | ඇය ගැන ඔයා මොකද හිතන්නේ ? |
| 她 很 漂 亮。 | තා හන් පියෝලියාං. |
| | ඇය බොහොම ලස්සනයි. |
| 她 特 别 聪 明。 | තා 'ටබියේ සොංමිං. |
| | ඇය හුඟක් දක්ෂයි. |

## 对 话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 你妹妹是做什么的？ | නී මෙයිමෙයි ෂ චුවෝ ෂන්ම ද? |
| | ඔයාගේ නංගී මොනවද කරන්නේ ? |
| 她是老师。 | තා ෂ ලඕෂ. |
| | ඇය ගුරුවරියක්. |
| 你是做什么的？ | නි ෂ චුවෝ ෂන්ම ද? |
| | ඔයා මොනවද කරන්නේ ? |
| 我是记者。 | වෝ ෂ චීච. |
| | මම වාර්තාකරුවක්. |

## 对话二 දෙවන සංවාදය

| | |
|---|---|
| 你觉得她怎么样？ | නී චුවෙද තා සන්මයන්? |
| | ඇය ගැන ඔයා මොකද හිතන්නෙ? |
| 她很漂亮。 | තා හන් පියෝලියාං. |
| | ඇය බොහොම ලස්සනයි. |
| 她特别聪明。 | තා 'ටබියේ සොංමිං. |
| | ඇය හුඟක් දක්ෂයි. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

29වෙනි ඔලිම්පික් උළෙලේ නිළ සුබ සළකුණ වන 福(fú) 娃(wá) කුඩා සුරතලුන් පස් දෙනාව ඔබ මේ වනවිට හොඳින් හඳුනනවා ඇති. මේ කුඩා සුරතලුන්ගේ පැහැය, චීන මහා ගොඩබිමෙහි සහ එහි වෙසෙන වනසතුන්ගේ ඇති විවිධත්වය වැනි දෑ හේතුවෙන් චීන ජනතාව එම සුබ සළකුණු කෙරෙහි වඩාත් ආකර්ශනය වී තිබෙනවා. 福(fú) 娃(wá) සුරතලුන් ලොවෙහි වෙසෙන සියලුම දුවාදරුවන්ට රැගෙන යන පණිවුඩය නම් මිත්‍රත්වය, සාමය, ධෛර්යය සම්පන්නබවෙහි ජීවගුණය සහ චීනයේ සුසංගත සමාජයේ ආශිර්වාදයයි. 福(fú) 娃(wá) සුරතලුන් පස් දෙනා වන්නේ මත්‍යසයා, යෝධ පැන්ඩා, ටිබෙටයට ආවේනික කුරංග මුව විශේෂය, වැහිළිහිනියා සහ ඔලිම්පික් ගිණිසිළයි. විශේෂත්වය වන්නේ චීනයේදී දරුවන්ට ආදරයට ආමන්ත්‍රණය කරන ද්විත්ව උච්චාරණය සහිත නම් තමයි මේ සෑම සුරතලෙකුටම තියෙන්නෙත්. ඒ තමයි බෙයිබෙයි, ජිංජිං, හුවංහුවං, ඊංඊං සහ නිනි. මෙහි ඇති අනෙක් අපූරත්වය තමයි මේ නම් පහ එකට යෙදූ විට එනම් "බෙයිජිං හුවංඊං නි" කියන්නේ "බෙයිජිං ඔබව සාදරෙන් පිළිගනියි" කියන උණුසුම් ආරාධනාවටයි.



# ඔබේ චීන භාෂාව ඉගෙනීමට ඇති පිපාසය සංසිඳවීමට අප සූදානම්

## අප ආයතනය මගින් පවත්වනු ලබන චීන භාෂා පාඨමාලා

**YCT පාඨමාලාව (වයස අවු. 11 - 16 දක්වා)**

**HSK පාඨමාලාව (වයස අවු. 16 ට වැඩි)**

**අ. පො. ස. උසස් පෙළ පාඨමාලාව**

අපගේ වෙනත් සේවා

- චීන විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යත්ව ලබා දීම
- ජාත්‍යන්තර තරගවලට සිසුන් යොමු කිරීම
- සංස්කෘතික වැඩසටහන් සඳහා සිසුන් සහභාගී කිරීම (දේශීය, විදේශීය)

4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත,
පොල්හේන්ගොඩ, කොළඹ 05.
P:O Box 1774, Tel: 0112515531, 0112515521
Email: criconfuciusclassroom@yahoo.com

# 2015 අර්ධ වාර්ෂිකය තුළ සී.ආර්.අයි. ශ්‍රී ලංකා කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ඉදිරිපත් කිරීම : වං යිං



## චීන වසන්ත උත්සවය සඳහා වන චීන-ශ්‍රී ලංකා සැමරුම් උත්සවය

චීන සම්ප්‍රදායික දින දර්ශනයට අනුව, මෙම වර්ෂය බැටළුවාගේ වර්ෂය ලෙස හැඳින්වෙයි. ගත වූ පෙබරවාරි මස 19වන දා චීනයේ නව වසර එළඹිණ. මේ නිමිති කොට ඉකුත් පෙබරවාරි මස 14වන දින, සැමරුම් උත්සවයක් සංවිධානය කරන ලදී. එය ෆෝර්චුන් බෝට් නම් වූ චීන අවන්හලකදී පැවැත්විණ. මෙම උත්සවය ශ්‍රී-ලංකාවේ චීන තානාපති කාර්යාලය, සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානය, කැළණිය විශ්ව විද්‍යාලයේ කොන්ෆියුසියස් ආයතනය විසින් ඒකාබද්ධ ව සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා චීන තානාපති ව සිටි වූ ජියං හාඕ මහතා ඇතුළු ආරාධිත අමුත්තෝ 300කට වැඩි පිරිසක් ඊට සහභාගී වී සිටියහ.

චීන භාෂාව ඉගැන්වීමේ කටයුතු සාර්ථක ලෙස පවත්වමින් සිටින බව ද සෑම වසරක ම වසන්ත උත්සවය සැමරීමේ උත්සවය අසිරිමත් ලෙස පවත්වා ගෙන යන බව ද මෙවැනි කටයුතු සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානය හා කැළණිය විශ්ව විද්‍යාලයේ කොන්ෆියුසියස් ආයතනය ඒකාබද්ධව සංවිධනය කරන බව ද එහිදී තානාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවල මිතුරන් හා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විවිධ චීන ආයතනවල සමීප සබඳතාවයෙන් මෙම කටයුතු සිදු කර ඇති බව දැන ගැනීමට ලැබුන බව ද චීන-ශ්‍රී ලංකා විවිධ මිත්‍රයන්ගේ පොදු උත්සාහයන් යටතේ දෙරට මිත්‍රත්වය වඩා වඩාත් දීප්තිමත් වන අතර සංස්කෘතික හුවමාරු කිරීම් මඟින් ඵලදායි ප්‍රතිඵල රැසක් ලබා ගත හැකි බව ද වූ ජියං හාඕ මහතා එහිදී වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මෙවර උත්සවයේ සංස්කෘතික අංග සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ හා කැළණිය විශ්ව විද්‍යාලයේ කොන්ෆියුසියස් ආයතනයේ ගුරු මණ්ඩලය හා සිසු සිසුවියන් එක් ව ඉදිරිපත් කරන ලදී. සිංහල නර්තනය, චීන සම්ප්‍රදායික නර්තනය, චීන නූතන නර්තනය, පී කිං ඔපෙරාව, වූෂු ඇතුළු වැඩසටහන් රැසක් ඊට ඇතුළත් විය. විශේෂයෙන් ම, සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් වූ කවිඳු මධුෂන් හා සඳනි විජේතුංග විසින් එම අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද සිත් ඇද ගන්නා සුළු චීන ගීත ගායනා පැමිණ සිටි ප්‍රේක්ෂකයන්ගේ සිත් පැහැර ගැනීමට සමත් විය. ඊට සාමගාමීව, එහිදී රැඳී සිටි ප්‍රේක්ෂකයන්ට චීන සම්ප්‍රදායන්ට සම්බන්ධ ක්‍රීඩා රැ සකට සම්බන්ධ වීමට ද අවස්ථාවක් ලැබිණි. මීට අමතරව, එම උත්සවයේදී එකල තානාපති වූ ජියං හාඕ මහතා ඇතුළු විශේෂ ආරාධිත අමුත්තන් විසින් කූසපත් ඇදීමෙන් ප්‍රේක්ෂකයන් විශාල පිරිසකට ත්‍යාග ප්‍රදානය කරන ලදී. එම උත්සවයේදී ශ්‍රී ලංකාවේ රැඳී සිටින චීන ජාතිකයන් හා එක්ව ශ්‍රී ලාංකිකයන් හට චීන වසන්ත උත්සව සංස්කෘතිය අත් විඳීමට මහඟු අවස්ථාවක් උදා වූ බව දක්නට ලැබිණ.



එකල ශ්‍රී ලංකා චීන තානාපති වූ ජියං හාඕ මහතා එම උත්සවයේදී දේශනයක් කළ අයුරු



සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ගුරුවරියන් දෙදෙනා සමග ශ්‍රීමාලි රංගායතනයේ සිසුවියන් විසින් ඉදිරිපත් කළ සිංහල නර්තනය



සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ ගුරුවරියන්ගේ චීන නූතන නර්තනය





උත්සවයේදී ළමුන් කීපදෙනෙක් චීන සම්ප්‍රදායික ආහාර වර්ගයක් වන ජාඕත්ස සාදන ආකාරය

## විදේශීය රටවල විශ්ව විද්‍යාලවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා 14වන "චයිනීස් බ්‍රිජ්" ජාත්‍යන්තර තරගයේ ශ්‍රී ලංකා ප්‍රාථමික තරගය සාර්ථක ලෙස පැවැත්වෙයි

විදේශීය රටවල විශ්ව විද්‍යාලවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා 14වන "චයිනීස් බ්‍රිජ්" ජාත්‍යන්තර තරගයේ ශ්‍රී ලංකා ප්‍රාථමික තරගය 2015 වර්ෂයේ අප්‍රේල් මස 25වන දා කැළණිය විශ්ව විද්‍යාලයේදී පැවැත්විය. ශ්‍රී ලංකා චීන තානාපති කාර්යාලයේ ප්‍රධානත්වයෙන් සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානය හා කැළණිය විශ්ව විද්‍යාලයේ කොන්ෆියුසියස් ආයතනය විසින් ඒකාබද්ධ ලෙස මෙම ප්‍රාථමික තරගය සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා චීන තානාපති යී ෂියැන් ලියං මහතා ඇතුළු ආරාධිත අමුත්තෝ 200කට වැඩි පිරිසක් ඊට සහභාගී වී සිටියහ.

එහිදී යී ෂියැන් ලියං මහතා එම තරගයේ ජයග්‍රහකයන් හා සියලු සහභාගී වූවන්ට සුභ පැතුම් පිරිනැමිය. ශ්‍රී ලංකා සිසු සිසුවියන් වැඩි පිරිසක් චීන බස හැදෑරීම සඳහා එක් වීමට බලාපොරොත්තු වන අතර නව යුගයේ චීන-ශ්‍රී ලංකා සංස්කෘතික අදහස් හුවමාරුව වෙනුවෙන් පෙනී සිටීමට හැකියාවක් ලැබෙන බව ද යී ෂියැන් ලියං මහතා අපේක්ෂා පළ කළේ ය.

ශ්‍රී ලංකාවේ විවිධ විශ්ව විද්‍යාලවල සිසු සිසුවියන් 24දෙනෙක් මෙම තරගයට සහභාගී වූහ. චීන භාෂාව ලිවීම, කතා කිරීම සහ සංස්කෘතික අංගයක් ඉදිරිපත් කිරීමෙන් කැළණිය විශ්ව විද්‍යාලයේ ටී. එම්. එන්. එස්. කේ. තෙන්නකෝන් ඉදිරියෙන් සිටීමට සමත් විය. ඇය පසුගිය ජූලි මාසයේ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් චීනයේදී පැවැත්වූ අවසාන මහා තරගය සඳහා තරග වැදිණ. සී.ආර්.අයි. කොන්ෆියුසියස් මධ්‍යස්ථානයේ හා සබරගමුව විශ්ව විද්‍යාලයේ සිසුවකු වූ ඩබ්. එස්. කසුන් බොතේජු දෙවැනි ස්ථානයේ පසු වීමට සමත් වූ අතර ඔහු එම අවසාන මහා තරගය නැරඹීමට අවස්ථාවක් හිමි කර ගත්තේ ය.

2011 වසරේදී ප්‍රථම වරට ශ්‍රී ලංකාව මෙම තරගයට සහභාගී වෙමින් ප්‍රාථමික තරගය දේශීයව සංවිධාන කළේ ය. මෙවර තරගය පැවැත්වූයේ 5වැනි වතාවටයි. මෑත වසර කිහිපයක් තුළ, චීනයේ ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් දක්නට ලැබේ. චීන-ශ්‍රී ලංකා ගැඹුරු මිත්‍රත්වයක් ද වර්ධනය වී ඇත. ඊට සාමග ාමීව ලාංකිකයන් වැඩි පිරිසක් චීන බස අධ්‍යයනය කරති.



චීන තානාපති යී ෂියැන් ලියං මහතා දේශනයක් කළ අයුරු



තරගකාරියක් ගායනා අංගයක් ඉදිරිපත් කළ අයුරු



තරගය සඳහා වූ සහභාගී වූවන් විශේෂ ආරාධිත අමුත්තන් සමඟ ඡායාරූප ගත් ආකාරය



# චීන
# ජීවන රටා



# අර්තාපල් රූපලාවණ්‍ය ක්‍රම

ඉදිරිපත් කිරීම : ශී යුයැ

අර්තාපල් කියන්නේ දෛනිකව දැකිය හැකි ආහාර වර්ගයකි. අල යොදා ගනිමින් ඔබට ලස්සන වෙන්න පුළුවන් කියලා ඔබ ඇතැම් විට දන්නවා විය හැකිය. අර්තාපල් වල විටමින් බහුලව තිබේ. එය ඇපල් වලට වඩා 20 ගුණයකින් ඉහළයි. අල භාවිතයෙන් සිදුකරන රූපලාවණ්‍ය ක්‍රමයක් ගැන ඔබට පැහැදිලි කිරීමට අපි කැමැත්තෙමු. අල යුෂ මුහුණේ සමට උරා ගැනීමෙන් මුහුණ පැහැපත් වෙයි. එපමනක් නොවෙයි, ඇස් යට සම සුසිනිඳු කිරීමට ද එය ඉවහල්වේ. ඇස් යට ඉදිමුම් බව අඩුකරයි. පලා වණ්‍යසත්කාරය කරන්නේ කෙසේද යන්න මෙසේ පැහැදිලි කරමි.

නොපිසන ලද අර්තාපල් වල ආවරණය ඉවත්කර තුනී පෙති විදිහට කපමින් සෘජුවම මුහුණේ තවරා විනාඩි



15කින් හෝ 20කින් ඒවා ඉවත්කර මුහුණ සෝදා ගත යුතුයි. ඉන්පසුව  නය වැඩි කරන ලෝෂණය මුහුණේ යෙදීමෙන් එම රූපලාවණ්‍ය කාර්යය සම්පූර්ණ වෙයි.

තවත් ක්‍රමයක් ඇත. තම්බාගත් අල පොඩිකර, එය කිරි හා මිශ්‍ර කරන්න, අල හා කිරිපහට එකක් යන අනුපාතයට මිශ්‍ර කර ගැනීම සුදුසුය. එසේ මිශ්‍ර කර ගත් තැවරුම මුහුනේ අලේපකර ගත යුතුය. විනාඩි 15 කින්හෝ 20 කින් සෝදා හරින්න. ඉන් පසුව



ලෝෂණයක් යෙදීමට ද අමතක නොකළ යුතුයි.

ඉහත සඳහන් කළ ක්‍රමය දිගටම භාවිත කිරීමෙන් මුහුණේ සම වඩත් සෞම්‍ය, පැහැපත් කර ගැනීමට හැකිවෙයි. එක් දවසක් පමණක් නොවෙයි, මෙම ක්‍රමය දිගටම භාවිත කිරීමෙන් ඔබට ඉතා හොඳ පැහැපත් සමක් උරුමකර ගත හැකිය.



# පොල් කිරි ගැන ඔබ නොදන්නා දේ



භූගෝලීය වශයෙන් චීනයත් ශ්‍රී ලංකාවත් එකිනෙකින් සැතපුම් දහස් ගණනාවක් ඈත් වුණත් චීනයේ විශාලත්වය සලකන විට ලංකාවේ  තියෙන බොහෝ උද්භිද වර්ග චීනයේත් දකින්න පුළුවන්. විශේෂයෙන් දකුණු චීනයේ හයි නන් සහ තායිවාන නම් ලොකු දූපත්  දෙක ලංකා දූපත හා බොහෝ සෙයින් සමාන වෙනවා. ශ්‍රී ලංකාවේ විශේෂයෙන් මුහුදු බඩ ප්‍රදේශයේ වැඩියෙන් වැවෙන පොල් එම දූපත් දෙකේත් නිරිතදිග චීනයේ යුන් නන් පළාතේත් දකින්න පුළුවන්. එම ප්‍රදේශවල වෙසෙන චීන ජාතිකයන් ශ්‍රී ලාංකිකයන් වගේ ම පොල්වලින් සෑදූ ආහාර පානවලට ආශාවක් දක්වනවා. ඒ අතරින් පොල් කිරි චීනය පුරාම ජනප්‍රිය පානයක් ලෙස සැලකිය හැකියි. පොල් කිරි බීමෙන් සිසිලසක් දැනෙනවා. පිපාසයත් තුරන් වෙනවා. ඒත් ඔබ නොදන්නවා ඇති, පොල් කිරි බීම නිසා ශරීරයට සුවිශේෂ කාර්යයක් ඉටු වෙන බව.

චීන වෛද්‍යවරුන් ස්වභාවයේ බොහෝ ශාබ වර්ග ඖෂධ වර්ග ලෙස සලකනවා. චීන සම්ප්‍රදායික ඖෂධ ග්‍රන්ථවල, පොල් කිරිවල මූලික ස්වභාවය මේ විධියට සටහන් වෙනවා: පොල් කිරි පැණි රසැති, සෞම්‍ය ලක්ෂණ හිම් විෂ රහිත යුෂ වර්ගයක්. පිපාසය තුරන් කිරීමට යහපත් පානයක් ලෙසත් එය හැඳින් වෙනවා. ඇත්තටම පොල් කිරි පානයෙන් ඇඟට යහපත් බව ඒ විතරක් නෙවෙයි. එමගින බඩේ රැඳී සිටින පණුවන් ඉවත් කිරීමටත් උපකාර

ඉදිරිපත් කිරීම : ලියු හුයි





වෙනවා. ඒ වාගේම පොල් කිරි බීමෙන් කිසිදු අතුරු හානියක් සිදු වන්නේ නැහැ.

පොල් කිරි වල ඇඟට අවශ්‍ය වන සීනි වර්ග, මේද වර්ග, ප්‍රෝටීන, විටමින් වර්ග අඩංගු වෙනවා. වැඩිහිටියන් නිතරම පොල් කිරි බොනවා නම් ශරීරයට ප්‍රාණවත්භාවය ලැබෙනවා. ඒ වාගේම සමේ තරුණකමත් පවත්වා ගැනීමට හැකි වෙනවා. පොල් කිරිවල ළමුන්ගේ වැඩීමට උපකාර වන හෝමෝන වර්ගයක් තිබීම තවත් වැදගත් ලක්ෂණයක්.

පොල් කිරි ඇඟට කොපමණ යහපත් වුණත් එය නිතරම බීම හොඳයි කියා කිව්වත් දවසකට අධික ප්‍රමාණයක් පානය කළොත් එය ඇඟට අහිතකර බව කිව යුතුයි. පොල් කිරිවල සීනි වැඩියි. වැඩිහිටියන් විශේෂයෙන් වියපත් අය මේ ගැන පරිස්සම් විය යුතුයි.









# වම්බටු ව්‍යංජනය



ඉදිරිපත් කිරීම : වං යිං



චීන ක්‍රමයට වම්බටු ව්‍යංජනයක් පිළියෙළ කරන විදිහ අපි ඔබට හඳුන්වා දෙන්නම්. වම්බටු ඉතා පෝෂ්‍යදායී ආහාරයක් බැවින් චීන ජාතිකයන් විවිධ ආකාරයට වම්බටු ආහාරයට ගන්නවා. වම්බටු වල විටමින් ඊ හා පී බහලව ඇත. ඒ වගේ ම ෆොස්ෆරස් යකඩ කැරොටීන හා ඇමයිනෝ අම්ල ද අඩංගුය. ඉන් ශරීරයේ රෝග වැළැක්වීමේ හැකියාව ද ඉහළ නැංවිය හැක. චීන භාෂාවෙන් වම්බටු චියෙත්ස නමින් හඳුන්වයි.

## අවශ්‍ය ද්‍රව්‍ය

වම්බටු ගෙඩි 2යි
ඌරු මස් කුඩා කැබලි ග්‍රෑම් 50යි
අල පිටි ග්‍රෑම් 50යි
සුදු ලූණු කැබලි කිහිපයක්
ලූණු
රසකාරක
විනාකිරි
සීනි
සෝයා සෝස් සුදුසු ප්‍රමාණයක්
තල සෝස් ස්වල්පයක්
අල පිටි ස්වල්පයක් හා සිසිල් ජලය එක්කර සකස් කර ගත් මිශ්‍රණයක්

## සාදන ක්‍රමය

වම්බටු සෝදා පොතු ඉවත් කර දිගටි තීරුවලට කපන්න. ඉන් පසු වම්බටු තීරු අල පිටිවල තවරා තෙලෙන් බැද ගන්න. නැවත වම්බටු රන්වන් පාට වන තුරු බදින්න. මෙසේ දෙවරක් බැදීමෙන් වම්බටු තීරු ඇතුලත මෘදු බව රැදෙනවා. (කර කර ගාලා සද්දෙ ඇහෙනවා) ඊළඟට තාච්චියේ තෙල් ස්වල්පයක් පමණක් ඉතිරි කර ගන්න. දැන් වැදගත්ම දේ සෝස් එක පිළියෙළ කර ගැනීමයි. මුලින්ම තෙල් තාච්ඡියට කුඩා ඉඟුරු හා මස් කැබලි එක්කර සුවඳ විහිදෙන තුරු බැද ගන්න. ඉන් පසු ලූණු, සීනි, විනාකිරි, සෝයා සෝස්, සුදු ලූණු කැබලි සහ ජලය ස්වල්පයක් එකතු කරන්න. මේ මිශ්‍රණය නටන තුරු ලිප තබන්න. අනතුරුව මුලින්ම පිළියෙළ කර ගත් අල පිටි හා ජලය මිශ්‍රණය ද තාච්චියට දමා හොඳින් බඳින්න. අවසානයේ බැදපු වම්බටු තීරු ද ඊට එක්කරන්න. ඒ මත තල සෝස් බිංදු කීපයක් ඉසින්න. දැන් ඔබට රස බලන්න පුළුවන්.


සී. ආර්. අයි
මිතුරන්ගෙන්

# මගේ ප්‍රථම චීන සංචාරය

අහිනයෙන් තම අදහස් හුවමාරු කරගත් ආදි මානවයා ශිෂ්ඨත්වයට පත්වීමට සමගාමීව "භාෂාව" මඟින් අදහස් හුවාමරු කටයුතු පහසුවෙන් සිදුකර ගන්නා ලදී. වර්තමාන ලෝකයෙ ජීවත් වන විවිධ ජන වර්ග අතර සංහිඳියාව ඇති කිරීමට මෙන් ම ජාතීන් අතර ඇතිවන අනවබෝධය දුරුකරගැනීමට ඉවහල් වන්නේ ද "භාෂාව"ම ය. එක් පුද්ගලයෙකු අවම වශයෙන් තමන්ට සමීපතම තවත් එක් භාෂාවක ප්‍රවීණත්වයක් ලබා නිසා වෙන් ඔහු ලෝකයට අනාවරණය වන අතර එය එම පුද්ගලයා සතුවන වත්කමක් ද වන්නේ ය. ශ්‍රී ලාංකික අධ්‍යාපනඥයකු ලෙස මා හට ප්‍රථම චීන සංචාරය උදාවුයේ මෙවැනි පසුබිමක ය. මා කුඩා කාලයේ සිට ම දුටු සිහිනය සැබෑ කර ගැනීමට දීර්ඝකාලයක් ගත වුවත් මාගේ අදහස වන්නේ අවශ්‍යම වූ කාලයක එම සංචාරය සිදුවූ බවයි. විශාලම සෞම්‍ය දේශගුණයකට හිමිකම්පාන යුන්නැන් පලාතේ කුන්මිං නගරයේ කෙටි කාලයක සංචාරය කරමින් මම සමස්ත චීනයේ පවතින සොඳුරු බව අත්විඳින දේ යැයි මාගේ විශ්වාසයයි. චීන ජනතාවගේ සුහදශිලී පිළිගැනීම, ලෙන්ගතුකම, ආගන්තුක සත්කාරයට පවතින කැපවීම, නීති ගරුක බව ආදී උසස් මානව ගුණාංග මා තව තවත ඔවුන් හා ඇළ බැඳීමට පිටුවහලක් විය. චීන ජනතාවගෙ මෙම මානව ගුණාංග මෙන් ම දියුණු යටිතල පහසුකම් හා එම දියුණු පහසුකම් වල පවතින ඉහල ගුණාතමක බව දැකීමෙන් සතුටු වූ මම ඒවා ඉතා ආඩම්බරයෙන්



පරිහරණය කළෙමි. සංචාරය අතරතුර "චීන භාෂාව" දැනගැනීමේ අවශ්‍යතාව ඉතා දැඩිව දැනෙමින් සිටිමට, චීන ජාත්‍යන්තර ගුවන්විදුලියේ සිංහල සේවයේ රවිමල් හඳුවල මහතා මුණ ගැහිණි. ඔහු සමඟ කුළුපග වීමත් සමගම ශ්‍රී ලාංකික ශිෂ්‍ය ප්‍රජාවේ කොටසක් වන රත්නපුර කහංගම බෞද්ධ පාසලේ සිසුන්ට "චීන භාෂාව" ඉගෙන ගැනීමේ අවස්ථාව උදාකරලිය යුතු බවට මා සිත තුළ අදහසක් ජනිත විය. ඒ ගැන රවිමල් හා ප්‍රකාශ කිරීමත් සමඟ ඔහු ඊට ධනාත්මකව ප්‍රතිචාර දැක්වූ අතර එම කටයුතු පහසුකර ගැනීමට සුදුසු ව්‍යුහයක් සකස් කිරීම උචිත බව අප දෙදෙනා අතර සාකච්ජා විය. අවස්ථාවක් බවට පත්කර ගැනීමට හැකිවනු ඇති බව මට හැඟිණි.

සංචාරය අවසන්කර ශ්‍රී ලංකාවට පැමිණ CRI-KBS අසන්නන්ගේ ශිෂ්‍ය සංසදය" බිහිකිරීමට ඉහත








අත්දැකීම් සියල්ල ඉවහල්වූ බව මගේ අදහසයි. චීන ජාත්‍යන්තර ගුවන්විදුලියේ සිංහල සේවයත් රත්නපුර කහංගම බෞද්ධ පාසලත් එකමුතුව ඉහත සංසදය බිහිවිය. සිසු දරු දැරියන් හා ගුරු මණ්ඩලයේ සාමාජිකත්වයෙන් සැඳුම් ලද අප සංසදයේ අනුශාසකත්වය දරණ ශ්‍රී ලංකාවේ RTS සමූහ ව්‍යාපාරයට අනුබද්ධ චීනයේ කුන්මිං නුවර ස්ථාන ගත කර ඇති හිදැල්ලනතේ කර්මාන්ත ශාලා පුද්ගලික සමාගමහි අධිපති ලලිත් ලියනගෙමහතා සිහිපත් කළයුතුමය. ඔහු නොසිටින්නට මගේ චීන සංචාරය සිහිනයක් ම වනු ඇත. චීන වෙළඳ පොළේ ශ්‍රී ලාංකික අනන්‍යතාව වන රත්නපුරයේ රසවත් " සිතක" නිමිතේ සහ අගනා "මැණික් " චීන වෙළඳ පොළ වෙත යොමුකරන ඔහු CRI-KBS අසන්නන්ගේ ශිෂ්‍යසංසදය" වෙත දක්වන අනුශාසකත්වය ඉතා ගෞරවයෙන් සිහිපත් කළයුතුමය. මගේ අපේක්ෂාව සුන්දර චීනයේ යළි වරක් සංචාරය කිරීමයි.

පියසිරි පතිරගේ

විදුහල්පති/සභාපති CRI-KBS අසන්නන්ගේ ශිෂ්‍යසංසදය"

ර/ කහංගම බෞද්ධ මහා විද්‍යාලය, කහංගම, රත්නපුර, ශ්‍රී ලංකාව

# අසන්නන්ගේ බිත්ති පුවරුව


W.M.S Maheshika Wijesooriya,
15, Boguskumbura,
Gunnapana,
Kandy.
Sri Lanka.











# අභයගිරි විහාරය

මහින්දාගමනයත් සමගම ශ්‍රී ලංකාව තුළ ආර්ථික, සමාජීය, සංස්කෘතික මෙන්ම ආගමික විප්ලවයක් සිදුවු බවට ඉතිහාසය සාක්ෂි දරයි. දෙවන පෑතිස් රජ දවස ශ්‍රී ලංකාවේ බුදු දහම පිහිටුවීමත් සමගම මෙරට ප්‍රථම බෞද්ධාගමික නගරය වුයේ අනුරාධපුරයයි. එහෙයින් අනුරාධපුර නගරයේ පූජනීය ආගමික ස්ථානවලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. දීපවංශය, මහා වංශය,සමන්ත පාසාදිකාවේ සඳහන් වන අන්දමට මිහිදුහිමියන් විසින් නම්කළ ආගමික ස්ථාන අටක් පිළිබඳව සඳහන් වේ. නමුත් ඒවා වර්තමානයේ අටමස්ථාන ලෙස හඳුන්වන ස්ථාන නොවන අතර පසුකාලීනව අටමස්ථාන ලෙස ශ්‍රී මහා බෝධිය, ලෝවාමහාපාය, ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිය, අභයගිරිය, ලංකාරාමය හා ජේතවනය හඳුන්වනු ලැබේ.

අභයගිරිය මහා විහාරය ශ්‍රී ලාංකිකයන්ගේ මහත් ප්‍රජාවන්ට ලක්වු විහාරයක්ව නඅතර මහින්දාගමනය මෙන්ම තවත් ආගමික කඩඉමක් සනිටුහන් කර ඇති විහාරයක් වේ.

මහාවංශයේ සඳහන්වන අන්දමට ද්‍රවිඩ ආක්‍රමණයන්ගෙන් බේරීමට වළගම්බා පලායන අවස්ථාවේ අභයගිරිය පිහිටි ස්ථානයේ සිටි ගිරිනම් නිගණ්ඨයා මහකළු සිංහලයා පලායයි යනුවෙන් අපහාස කල බවත්, පසුව වසර 14 ට පසු පැමිණි වලගම්බා රජු එම ස්ථානයේ පිහිටි නිගන්ඨ දේවාලය කඩාදමා මහා සෑයක් කරවු බවත් එය අභයගිරිය වන බවත් සඳහන් වේ. එසේම එය තමන්ට උපකාරකල කුප්පිකල තිස්ස හිමියන්ට පූජා කළ අතර එමගින් සංඝ බේදයක් ඇතිවූ බවත් මහාවංශයේ සඳහන් වේ. නමුත් වලගම්බා රජ දවස බොහෝ සෙයින් පදු සත්කාර රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇත්තේ අභයගිරි විහාරයටය.

ක්‍රිස්තු පූර්ව පළමු සියවසේ වලගම්බා රජ කරවු මෙම විහාරය එකොලාස්වන සියවස දක්වාම හොඳින් ක්‍රියාත්මක වූ බව සඳහන් වේ. එහි ශාඛා ආරාම විදේශ රටවලද පැවති බවට නිදසුනක් ජාවා රටේ පවතී. අභයගිරි සිංහ භික්ෂුන්ගේ ආරාමය. නම් සංස්කෘත ශිලා ලිපියක් එහිදි හමුවි ඇත. එසේම මෙය පැරණි ඉන්දියාවේ පැවති නාලන්ද, වික්‍රමශිලා වැනි බෞද්ධ ආරාධිත විශ්ව විද්‍යාල ගනයට ඇතුලත් කල හැක.

ගුණවර්ධන නම් කාශ්මීර රජතුමා පාහියන් වැනි චීන ජාතික භික්ෂුව ඇතුළු විදේශිය පිරිස් ආගමික අධ්‍යාපනය සඳහා මෙහි පැමිණ ඇත. පාහියන් හිමියන්ගේ සටහන්වලට අනුව 5 වන සියවස වන විට මෙහි භික්ෂූන් වහන්සේලා 5000 ක් පමන වැඩ සිටි බවට සඳහන් වේ.

මහා විහාරය ථෙරවාදයට පමණක් සීමාවී තිබියදී අභයගිරිය හා ඒවා ප්‍රකාශණයට ඉඩලබාදී ඇත.

ඇතුළුනුවරට උතුරින් පිහිටි බැවින් මෙය උත්තර මහා චෛත්‍යය ලෙසද හැඳින්වේ. වලගම්බා රජ කරවු මේ ස්තූපයට ගජබාහු රජතුමා සතර දිශාවේ ආදිමුඛ නම් වූ අංගයක් සාදා ඇත. කණ්ට්ඨතිස්ස රජතුමා එම ආදිමුඛ නම් වූ අංගයක් සාදා ඇත.කණ්ටඨතිස්ස රජතුමා එම ආදිමුඛ වැඩිදියුණුර වාහල්කඩ කරවු බවත්, මහා පැරකුම්බා රජ එම ස්තූපය අවස්ථාවට පිළිසකර කරබවත්, සඳහන් වේ. සතර මුලයකින් වටවූ අභයගිරිය ගොඩනැගිලි පහකින් යුක්තවේ. ඒවා පුරාණයේ පිරිවෙන, ප්‍රාසාද, ආරාම, කුඩා දාන ශාලාවක් හා ජන්තාසරයකින් සමන්විත වේ.ජන්තාසරය යනු භික්ෂූන් වහන්සේලාගේ ශරීර සුවතාව සඳහා ජලය උණුකර ස්ථානය සඳහා යොදාගත් ස්ථානයකි. එවැනි ස්ථාන චීනයේද ඇති අතර දෙරට අතර මහා සබැඳියාවක් මෙම කාළයේ සිට පැවත එන්නට ඇතැයිද අනුමාන කළ හැක. අභයගිරිය නිර්මාණය කර ඇති ස්ථානය අටමස්ථාන නැතිනම් සොලොස්මස්ථාන වලට අයත්වන අතර බුදුරදුන්ගේ පාදස්පර්ශයෙන් පහස ලද ස්ථානයක් ලෙසද හඳුන්වනු ලැබේ. අභයගිරි විහාරය උසින් අඩි යුක්ත වන අතර පහළ පේසාවේ විශ්කම්භය මීටර් 120 කි. දාන ශාලාවේ ඇති අඩි 19 ක දිග බත් ඔරුවේ පාත්‍රා 5000 ක ධාරිතාවයක් ඇත. පසෙකින් ඇති කුඩා ඔරුව ව්‍යංජන සඳහාය. පසෙකින් පාත්‍රා වියලීම සඳහා වූ ගල් විලක් ඇත. සූර්යා ලෝකයෙන් වේලාව දැක්වු හෝරා තැටියක්ද මෙහි හමුවී ඇත.

රත්න ප්‍රාසාදය යනු අභයගිරියේ පෝය ගෙයයි. එය දිව්‍ය විමානයක් බඳුවූ බව 5 වන කාශ්‍යපගේ අභය ගිරි ශිලා ලිපියේ සඳහන්වේ. ස්තූපයේ දකුණු දොරටුවේ සංඛ පද්ම රූප සහිත මුරගල් මගින් කුවේර සංකල්පය දක්වයි. එසේම ලංකාවේ දක්නට ලැබෙන කලාත්මකම සඳකඩ පහන දක්නට ලැබෙන්නේ මෙයටම යාබද ආරාම ගොඩනැගිල්ලකය.

ශ්‍රී ලංකාවට දළදාව වැඩමවන අවදියේ ටනම් 4 වන සියවසේදි කිත්සිරි මෙවන් රජ දවස, දළදාවේ භාරකාරත්වය හිමිවුයේ අභයගිරියේ පැරණිතම භික්ෂු කණ්ඩායම වූ උත්තර මුලයටය. අනුරාධපුර යුගයේදි දළදා පෙරහර පැවැත්වුයේද ඇතුළුනුවර සිට අභය ගිරි විහාරය, බුදුදහම පවතින තුරාවට විරාජමානව පැවති යන්න සමස්ථ බෞද්ධ ජනතාවගේ ඒකායන ප්‍රාර්ථනාවද වේ.

ඉන්දිරා ප්‍රියදර්ශනි නවගමුව.

සිව්වන පාඩම

# ස්වසනය කරන අසිහි පුද්ගලයෙකුට ප්‍රථමාධාර කරමු

නිශ්චලව වැටී සිටින පුද්ගලයෙකුට මූලික විනිශ්චය හෙවත් ප්‍රධානම ජෛව සාධක ක්‍රියාත්මකදැයි පරීක්ෂා කරන අයුරු අප මෙම පාඩම් මාලාවේ දෙවන පාඩමෙන් ඉගෙන ගතිමු. එසේ පරීක්ෂාකිරීමෙන් අනතුරුව අදාළ පුද්ගලයා අසිහි තත්ත්වයේ පසුවේනම් සහ ස්වසනය කරයි නම් ඉන් ඉදිරියට කළයුතු ප්‍රථමාධාර පිළිබඳව සාකච්ඡා කරමු.

සිහිනැතිවීම යනු පුද්ගලයෙකු බාහිර පරිසරය සමඟ සෑම ආකාරයකින්ම ඇති සම්බන්ධතාවය හෙවත් ප්‍රතිචාර දැක්වීමේ ස්වභාවය නැතිව වී යාමයි.

එසේ පුද්ගලයෙකු සිහිනැති තත්ත්වයට පත්වීමට බලපානහේතු සාධක ගණනාවක් තිබේ. ක්ලාන්තය, ශරීරයේ උෂ්ණත්වය අධිකලෙස ඉහළ යාම හෝ පහළ යාම, කම්පනය හෙවත් විවිධ හේතු (හෘදයාබාධ, අධික රුධිර වහනය, අධික පිළිස්සීම, විජලනය, විදුලි සැරවැදීම ආදී) නිසා ශරීරයේ මොළය හා හෘදය ඇතුළු අත්‍යවශ්‍ය ඉන්ද්‍රියයන්ට ප්‍රමාණවත් තරම් ඔක්ෂිජන් සහිත රුධිරය නොලැබීයාම නිසා ඇතිවන තත්ත්වය, නිෂ්පූර්ණය හෙවත් විවිධ හේතු (උගුරේ යමක් සිරවීම, ස්වසනය කරන අවකාශයේ ඔක්ෂිජන් රහිත වීම, ඇදුම උත්සන්න වීම, ගෙල හෝ පපුව ප්‍රදේශය සිරවීම ආදී) නිසා ශරීරයේ පටකවලට ප්‍රමාණවත් තරම් ඔක්ෂිජන් නොලැබීයාම නිසා ඇතිවන රෝගී තත්ත්වය, දියවැඩියාව, හිසට වන අනතුරු, අසාත්මිකතා, මීමැස්මොරය, වෂවිෂ ශරීරගත වීම ආදී හේතු පුද්ගලයෙකු අසිහි තත්ත්වයට පත්වීමට බලපාන ප්‍රධාන හේතු සාධක කිහිපයකි.

මෙවන් හදිසි අවස්ථාවන්වලදී අසිහි පුද්ගලයා ස්වසනය කිරීමට හෝ නොකිරීමට පුළුවන. ස්වසනය කරන්නේනම් එම පුද්ගලයා ආරක්ෂිත ඉරියව්වේ තබා ඉක්මනින් රෝහල්ගත කළයුතුය. ඊට හේතු දෙකකි.

01. දිව මගින් ස්වසන මාර්ගය අවහිරවිය හැකිවීම

02. වමනය, කෙළ, සෙම ආදිය මගින් ස්වසන මාර්ගය අවහිර විය හැකිවීම

ඉහත ප්‍රධාන හේතු දෙක නිසා පුද්ගලයෙකු ආරක්ෂිත ඉරියව්වේ තැබීම මගින් ඔවුන්ගේ ප්‍රධාන ජෛව සාධකවලට හෙවත් ස්වසනය සහ රුධිර සංසරණයට වන බාධා අවම කර ගැනීමට හැකියාව ලැබේ. මෙවන් අවස්ථාවකදී පුද්ගලයාගේ ස්වසනය සහ රුධිර සංසරණය පවත්වා ගනිමින් රෝහල්ගත කිරීම එම පුද්ගලයාගේ ජීවිතය බේරා ගැනීමට බෙහෙවින් ඉවහල්වේ.

එම නිසා අසිහි රෝගියෙකු ආරක්ෂිත ඉරියව්වට හරවන ආකාරය අප දැන් විමසා බලමු.

## පළමු පියවර



පළමුවෙන් රෝගියාගේ ඔබ වාඩිවී සිටින පැත්තේ ඇති L අකුරේ හැඩයට තබන්න. හරවන ඇලයේ ආගන්තු දේවල් (යතුරු කැරලි, දුරකථන ආදී) දෑ ඇත්නම් ඉවත් කරන්න. දරුණු තුවාල, අස්ථි භග්න ඇත්නම් ඒවාට ප්‍රථමාධාර කරන්න.

## දෙවන පියවර



ඔබට විරුද්ධ පැත්තේ රෝගියාගේ ඇති අත ගෙන ඔබේ පැත්තේ රෝගියාගේ කනට හා කම්මුලට තබා අල්ලා ගන්න.

## තෙවන පියවර



ඔබට විරුද්ධ පැත්තේ ඇති රෝගියාගේ දණහිසට යටින් අත දමා දණහිසෙන් නැවෙන පරිදි ඔසවන්න.

## සිව්වන පියවර



නැවූ පාදයෙන් අල්ලා රෝගියා තමාගේ පැත්තට හරවන්න.

## ආරක්ෂිත ඉරියව්ව (පියවර 4)




පියවර 4 දැක්වෙන රූපයේ පරිදි රෝගියා හරවා තබා රෝහලක් වෙත ප්‍රවාහනය කිරීමේදී පහත දැක්වෙන වාසි අත්කර ගත හැකිය.

01. දිව මගින් ස්වසන මාර්ගය අවහිරවීම වැළැක්වීම

02. වමනය වැනි තරල ස්වසන මාර්ගයේ සිරවීම අවම කොට මුඛය මගින් ඉවත් වීමට ඉඩහැරීම

අසිහිවූ පුද්ගලයා අනතුර හෝ රෝගී තත්ත්වය උත්සන්න වීමට ආසන්න කාලය තුළ කිසියම් ආහාරයක් හෝ පානයක් ගෙන තිබුණේ නම් අසිහි අයෙකුගේ ඒවා තම උගුරේ හිරවිය හැකි බැවින් ආරක්ෂිත ඉරියව්වේ තැබීම උචිත වන්නේ ඒනිසයි. අසිහි තත්ත්වයට පත්කොට ශල්‍යකර්මයක් සිදුකිරීමට නියමිත නම් වෛද්‍යවරු ඊට පෙර පැය කිහිපයක් තුළ අප හට ආහාර පාන ගැනීමට එපායයි කියන්නේ මෙම වමනය යෑමේ අවදානම නිසා ශල්‍යකර්මයට වුව බාධාවිය හැකි බැවිනි.

ආරක්ෂිත ඉරියව්වට හැරවීමෙන් අනතුරුව වුවද රෝහලට රැගෙන යන තෙක් රෝගියාගේ ස්වසනය හා රුධිර සංසරණය වරින්වර පරීක්ෂා කිරීම සිදු කළයුතුය. එමෙන්ම ගර්භණී මවක අසිහි තත්ත්වයේ හෝ මද සිහි තත්ත්වයේ සිටී නම් වඩාත් සුදුසු වන්නේ ඇගේ වම් පසට ආරක්ෂිත ඉරියව්වට හැරවීමයි. ඒ රුධිර නාල තද වී රුධිර සංසරණයට බාධාවීම අවම කිරීම සඳහායි. එමෙන්ම අනෙකුත් අසිහි පුද්ගලයන් ද වම් පසට හැරවීමෙන් වමනය ඇතිවීමට අවම කිරීමට හේතු වේ.

කශේරුකාවට හානි වී තිබීම, පර්ශුවල හෝ වෙනත් අස්ථිවල භග්න තිබෙන අවස්ථාවලට එක්වරම ඉහත පරිදි අසිහි ස්වසනය කරන රෝගියෙකු ආරක්ෂිත ඉරියව්වට හැරවීම අවදානම් විය හැකිය. ඒනිසා එවන් අවස්ථාවල ආරක්ෂිතව ස්වසන මාර්ගය විවෘත කොට තබා රෝහල්ගත කිරීමට හෝ 'ලොග්රෝල්' ක්‍රමය වැනි උසස් ප්‍රථමාධාර ක්‍රම ශිල්ප මගින් රෝගී න් හැරවීමට සිදු කළ හැකිය.

පහත දැක්වෙන අවස්ථාවලද රෝගීන් ආරක්ෂිත ඉරියව්වේ තබා රෝහල්ගත කිරීම සුදුසුය.

- මද්‍යසාර ගෙන මදසිහියෙන් සිටින අවස්ථාවල
- මීමැස්මොරය සෑදී ගැස්සීමෙන් අනතුරුව නින්දේ පසුවන විට
- දියේ ගිලීමකින් බේරා ගත් ස්වසන කරන අය
- වස විෂ ශරීරගත වී මද සිහියේ සිටින අය
- ක්ලාන්තය සෑදී දිගුවේලාවක් ප්‍රතිචාර නොදක්වා සිටින අය

ස්වසනය නොකරන අසිහි රෝගියෙකුට ප්‍රථමාධාර කිරීම හෙවත් CPR ඇතුළත් මූලික ජීවිතාරක්ෂක ක්‍රියාවලිය සිදුකරන අයුරු අප ඊළඟ පාඩමෙන් ඉගෙන ගනිමු.

ජීවිතයට අතිශය වැදගත් මෙවැනි ප්‍රථමාධාර ක්‍රම ශිල්ප පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඔබට ලබා ගත හැක.

ඒ පිළිබඳ තොරතුරු සඳහා www.redcross.lk වෙත පිවිසෙන්න. කතාකරන්න 0115347000.








සුභාසර පාඨක සාමාජිකත්වය

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව ත්‍රෛයි මාසිකව නිකුත් කරනු ලබන සුභාසර සඟරාවේ පාඨක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත විස්තර පුරවා මෑතකදී ගත් 2.5 x 3.5 cm ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපගේ ලිපිනය වෙත යොමු කරන්න.

නම : ..........

ලිපිනය : ..........

වයස : .......... පාසල : ..........

දුරකථන : .......... විද්‍යුත් ලිපිනය : ..........

ප්‍රශ්නය : මෙවර සුභාසර කලාපයේ ඔබ වඩාත් කැමති ලිපිය කුමක්ද?

පිළිතුර : ..........

අපගේ ලිපිනය : 4/91A, 5 වන පටුමග, තලකොටුව වත්ත, පොල්හේන්ගොඩ, කොළඹ 05. P. O Box : 1774




| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 11:30-13:30 | 17:30-19:30 |
| Short wave | 49.8/31.6/30.61/25.21 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ට්න් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL

**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2330/2374
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka